# 'පට්ඨාන' දාහතරවැනි දේශනාව

නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධසස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධසස
නමො තසස භගවතො අරහතො සම්මා සම්බුදධසස

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදුරජාණන්වහන්සේට සාරා අසංඛ්‍ය කල්ප ලක්‍ෂයකට අධික කාලයක් මුළුල්ලේම සත්වයන් කෙරෙහි පතලා වූ මහා කරුණා ගුණයෙන් සන්තානය පුරවාගෙන දස පාරමී ධර්මයන් සම්පාදනය කොට ගත්තාවූ ශාන්ති නායක සම්මා සම්බුදුරජාණන්වහන්සේට දුක්ඛය සමුදය නිරෝධය මාර්ගය කියන්නාවූ අති ගාම්භීර වූ චතුරාර්ය සත්‍ය ධර්මයන් තමන් වහන්සේගේ සන්තානයේ පහළ වූ ස්වයම්භූ ඥානයෙන්ම පිරිසිඳුව පැහැදිලිව අවබෝධ කොට ගත්තාවූ ධර්මය ලෝකයාට කරුණාවෙන් දේශනාකොට වදාළා වූ ශාන්තිනායක සම්මා සම්බුදුරජාණන් වහන්සේට අෂ්ඨලෝක ධර්මයෙන් කම්පානොවන ඍජු සන්තානයක් ඇත්තාවූ ශාන්තිනායක සම්මා සම්බුදුරජාණන් වහන්සේට මම මේ වෙලාවේ සිරසින් වැඳ නමස්කාර කරනවා මගේ නමස්කාරය වේවා!

ඒ උතුම් ශ්‍රී සද්ධර්ම රත්නයට සත්වයන්ගේ සන්තාන ගත කෙලෙස් නිවාලන්නාවූ සංසාර ගත සත්වයන් ඒ සසරින් මුදවාලන්නාවූ නිර්වාණයට යොමු කරන්නාවූ ශාන්ත වූ ප්‍රනීත වූ ශ්‍රී සද්ධර්ම රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා මගේ නමස්කාරය වේවා!

ඒ උතුම් බුදුරජාණන්වහන්සේ විසින් දේශිත ධර්ම මාර්ගයේ සුපටිපන්න ආදී ගුණ දරාගෙන ගමන් කොට වදළාවූ ආහුනෙය්‍යා පාහුනෙය්‍යා ආදී සංඝ ගුණයන්ගෙන් සමලංකෘත පිරිසිඳු උතුම් පුණ්‍යක්ෂේත්‍ර බඳු ජීවිත දරන්නාවූ සසර දුකින් මිදී ගියාවූ ඒ ආර්ය ශ්‍රාවකයන් වහන්සේලාට මහා සංඝ රත්නයට මම සිරසින් වැඳ නමස්කාර කරනවා මගේ නමස්කාරය වේවා!

බුද්ධ රත්නයට ධර්ම රත්නයට සංඝ රත්නයට නමස්කාර කිරීමේ කුසල් චේතනාවන්ගේ ආනුභාව බලයෙනුත් බුද්ධ ධම්ම සංඝ යන ත්‍රිවිධ රත්නයේ අනන්ත අපරිමාණ ගුනාණුභාව බලයෙනුත් මේ පිංවත් සැමදෙනාම මුළු ජීවිත කාලය පුරාම දාන සීල භාවනා වශයෙන් සීල සමාධි ප්‍රඥා වශයෙන් උපදවා ගත්තාවූ සියලුම කුසල ධර්මයන්ගේ ආනුභාව බලයෙනුත් අදත් අපි මෛත්‍රීයෙන් යුක්තව මේ අවස්ථාවට ගැලපෙන පරිදි කියල දෙන්ට බලාපොරොත්තු වන්නාවූ ගාම්භීර පට්ඨාන ධර්ම කරුණු ඉතාමත්ම හොඳින් තේරුම් ගන්ට වටහා ගන්ට අවබෝධ කර ගන්ට සැමදෙනාටම ශක්තිය ලැබේවා! ඒ සඳහා අවශ්‍ය කරන්නාවූ සිහිය සමාධි ගුණය ප්‍රඥාව වැඩේවා! වික්ෂිප්ත සිතකින් නැතුව නීවරණයන්ගෙන් පීඩා විඳින හිතකින් නැතුව නිස්කලංක ඉවසීම් සහගතව සිහියෙන් පිරිච්ච හිතකින් මේ කරුණු අසා ගෙන ඒවා ගැඹුරින් අවබෝධ කරගෙන බුද්ධාදී උත්තමයන් වහන්සේලා අවබෝධ කරගත්ත සදාකාලික සැප ඇති අමාමහ නිවනින් සැනසෙන්ට ලැබේවා! නිවන් පිණිස මේ කුසල් මේ පිං හේතුවේවා! කියල මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. ඒවගේම මෙය නිවන් මාර්ගයක් වේවා! කියල මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා.

ඉතින් අද අපි මීට ඉස්සරවෙලා කථා කරපු ධර්ම කාරණයක කොට්ඨාසයක් තමයි ඉදිරිපත් කරගන්ට තියෙන්නේ. පසුගිය අවස්ථාවේදී අපි කථා කරා සහජාත ප්‍රත්‍යය ධර්ම පිළිබඳව. සහජාත ප්‍රත්‍යය ධර්ම මම විස්වාස කරන හැටියට මේ පිවතුන්ට ඒ තරම් අමාරුවක් වෙන එකක් නෑ කියල හිතනවා. සමහර තැන්වලදී පොඩ්ඩක් වචන අනුසාරයෙන් යනකොට පොඩි පොඩි ගැටළු තැන් ඇති උනොත් අපි ඒවා කියල දෙනවා. ගිය අවස්ථාවේදී සහජාත ප්‍රත්‍යය ධර්ම කියල කිව්වේ - ඒ සහජාත ධර්ම ඔවුනොවුන්ට - එකිනෙකට උදව් වෙන - උපකාර කරන ගුණ දරන්නාවූ දේවල්. කවදාකවත් එකම දෙයක් සහජාත භාවයෙන් අයින් වන්නේ නෑ නාම ධර්මයන්ගෙන්. ඒ නිසා නාම ධර්ම විග්‍රහ කරනකොට මේ සහජාත ප්‍රත්‍යය ධර්ම යටතේ භාෂාව යොදල තියෙන්නේ **'චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං'** යයි කියල. සතර ස්කන්ධයෝ - එතන **'අරූපිනො'** කියන වචනයත් එක්ක අරූපී වූ ධර්ම තමයි - රූප නොවන්නාවූ ධර්ම - නාම ධර්ම. එතකොට එතන ගණන් ගන්නේ සිත් ටිකයි චෛතසික ධර්ම 52 යි. ඒ චෛතසික ධර්ම වලිනුත් කොටස් තුනක් - ධර්ම ස්කන්ධ තුනක් හැදෙනවා කියල අපි කිව්වා. ඒ තමයි 'වේදනා ස්කන්ධය' 'සංඥා ස්කන්ධය' සහ 'සංස්කාර ස්කන්ධය' කියල. ඊළගට ඉතිරි එක තමයි 'හිත' 'විඤ්ඤාණ සකන්ධය'. ඉතින් මේ ස්කන්ධ හතර ඔවුනොවුන්ට සහජාත භාවයෙන් එකට පහළ වීම් වශයෙන් ඔවුනොවුන්ට උදව් වෙනවා උපකාර වෙනවා. මේකේ හරි අපූරු ධර්මස්වභාවයක් තිබෙනවා. ඒ ධර්ම ස්වභාවය තමයි හිත පහළ වෙන කොටම - අදාළව තිබෙන්නාවූ ඒ චෛතසික ධර්ම ටික ඒ එක්කම පහළ වෙනවා.

ඒක කොහොමද කියන්නේ කියල හිතුවොත් එහෙම දැන් අපි බිත්තියක ඉරක් ඇන්දොත් පහළට, ඒ ඉර අඳින කොටම - ඒ අඳින ප්‍රමාණයට දිග නිර්ණය වෙනවා. අපි හිතමු ඉරක් ගැහුවා. ඉරක් ගහන කොට තියෙන්නේ අඩියක් විතර. එතකොට ඒ අඩියක ප්‍රමාණය කියන එක අඳින කොටම ඒකත් එක්ක තමයි එන්නේ. ඒවගේම අඟල් 12 කියන එක ඒ එක්කම තමයි එන්නේ. ඊළඟට ඉර උඩ ඉඳල පහළට ඇන්දොත් එහෙම ඇඳපු ගමන්ම - ඒ ඉර අඳිනවත් එක්කම මතුවෙන ධර්ම දෙකක් තමයි ඒකෙ උඩ සහ පහළ. ඒ කියන්නේ උඩ කෙලවර පහළ කෙලවර.

ආන්න ඒ වගේ හිත පහළ වෙන කොටම ඒ එක්කම අත නොහැර ඒකටම බැඳිල පවතින ධර්ම සවභාවයෝ තියෙනවා. මනුෂ්‍යයෙක් - අපි හිතමු සහජාත ධර්ම තේරුම් ගැනීමට උපකාර වෙන්න කාමරයක මෙහා කෙලවරේ ඉඳල එහා කෙලවරට යනවා. ඒ මනුස්සයාගේ අතද පයද ඔළුවද සෑම අංග උපාංගයක්ම ඉදිරියට යන බිත්තිය ගාවට කිට්ටුවෙනවා. ඒ එක්කම අනිත් බිත්තිය දුරු වෙනවා. අන්න ඒ වගේ එක වෙලාවක සිද්ධ වෙන්නාවූ ක්‍රියා සවරූපයක්. ඔය නාම ධර්ම එක්ක කියවුනා.

**'චත්තාරො මහාභූතා අඤ්ඤමඤ්ඤං සහජාතපච්චයෙන පච්චයො'** - අපේ පින්වතුන් මම විස්වාස කරනවා රූප ධර්ම 28 පිළිබඳව යම් කිසි අවබෝධයක් හදාගෙන තියෙනවා කියල. මේ රූප ධර්ම වල තිබෙනවා ප්‍රධාන වර්ග දෙකක්. කොටස් ගොඩක් තිබෙනවා අධ්‍යාත්මික රූප බාහිර රූප වශයෙන්, නමුත් මේකේ තිබෙනවා ප්‍රධාන වශයෙන් රූප වර්ග දෙකක්. එකක් තමයි 'මහා භූත රූප' සහ 'උපාදාය රූප' කියල. රූප 28 න් 4 ක් මහා භූතයි. ඒ

කියන්නේ මව් රූප. ප්‍රධාන රූප. අපි නිතර කථා කරනවා ලෝකයේ පඨවි ආපෝ තේජෝ වායෝ කියල. මේ තමයි මහා භූත - ප්‍රධාන රූප. මේ රූප 4 මහා භූත රූප වෙනකොට අනිත් 24 ම 'උපාදාය රූප' කියල කියනවා. උපාදාය රූප කියල කියන්නෙ මේ මහා භූත රූප ආශ්‍රය කරගෙන ඒවා අතහරින්නේ නැතුව මේක ප්‍රධාන කරගෙන එතන ගැලී තිබෙන්නාවූ තවත් රූප ගුණ ස්වභාවයෝ. ඒවාට කියනවා උපාදාය රූප කියල.

එතකොට - **'චත්තාරො මහාභූතා අඤ්ඤමඤ්ඤං සහජාතපච්චයෙන පච්චයො'**

මේ වාක්‍ය හරි වටිනවා තේරුම් ගැනීමට - මහා භූත 4 තමයි ඔවුනොවුන්ට සහජාත ප්‍රත්‍යය භාවයෙන් ප්‍රත්‍යය වෙන්නේ.

ඊළඟට කිව්ව අපි **'ඔක්කන්තික්ඛණෙ නාමරූපං අඤ්ඤමඤ්ඤං සහජාතපච්චයෙන පච්චයො'** කියල. **'ඔක්කන්තික්ඛණෙ'** කියල කිව්වේ උපදින අවස්ථාවේ - ප්‍රතිසන්ධියක් ගන්න අවස්ථාවේදී - මවුකුසේ නම් ඒ මව්කුසේ. වෙනත් ඕපපාතික ජීවිතයක නම් ඒ නාම රූප ධර්මයෝ. **'ඔක්කන්තික්ඛණෙ'** කියන්නේ විශේෂයෙන්ම පංචඋපාදාන සකන්ධයම තියෙන එහෙම නැත්නම් සකන්ධ පහම තිබෙන්නාවූ පංච වෝකාර භවයෙහි ප්‍රතිසන්ධිය ගන්න කොට - **'ඔක්කන්තික්ඛණෙ නාමරූපං අඤ්ඤමඤ්ඤං සහජාතපච්චයෙන පච්චයො'** -නාමය සහ රූපය ඒ අවස්ථාවේදී ඔවුනොවුන්ට සහජාත වෙනවා කියල කිව්වා.

ඊට පස්සේ කියනවා **'චිත්තචෙතසිකා ධම්මා'** = 'චිත්ත චෛතසික ධර්මයෝ - සිතත් චෛතසිකයනුත් දෙකම මේ රූප වර්ගයකට සහජාත භාවයෙන් උපකාර වෙනවා - එකට උපදිනවා. ඒ තමයි (රූප වර්ග 4 ක් තිබෙනවා. කර්ම සමුට්ඨානික රූප - චිත්ත සමුට්ඨානික රූප - ඍතු සමුට්ඨානික රූප - ආහාර සමුට්ඨානික රූප) මේ හතරෙන් අපි හිතක් පහළ කරන කොට යමක් හිතන වෙලාවේම ඒ හිතේ තිබෙන්නාවූ යම් කිසි ශක්ති විශේෂයක් නිසාවෙන් හිතේ තිබෙන බලයක් නිසා ඒකත් එක්කම යම් කිසි රූප පහළ වෙනවා. සිතත් සමග ඒ රූප පහළ වෙන නිසා කියනවා 'චිත්ත සමුට්ඨාන රූප සහජාත භාවයෙන් ඇතිවෙනවා කියල'.

ඊළඟට තියෙනවා **'මහාභූතා උපාදාරූපානං සහජාතපච්චයෙන පච්චයො'** -

මහාභූත රූපයෝ 4 දෙනා - පඨවි අපෝ තේජෝ වායෝ - ඒ 4 දෙනා **'උපාදාරූපානං'** – උපාදාය රූපයන් සමග සහජාත භාවයෙන් එකට ඉපදීම් වශයෙන් පහළ වෙනවා. ඒක අපිට පොකුරු රූප ධර්ම කියල හිතාගන්ට පුළුවන්. ඒ තමයි - මහා භූත රූපයි උපාදාය රූපයි ගත්තම - අපි දසක කලාප කියලා කියනවනේ. දැන් ඉස්සරවෙලා ඉගෙන ගත්ත ධර්ම කොට්ඨාස නැවත හිතේ ධාරණය වෙලා තිබෙන දේවල් - අහල තිබෙන දේවල් නැවත හිතෙන් හාර අවුස්සලා මේ පට්ඨාන ධර්මයට යොමු කරලා බැලීමට මෙනෙහි කිරීමට හොඳ අවස්ථාව. අපි කර්මජ රූප කොටසක් පිළිබඳව කථා කරා. කර්මජ රූප කියල කියනවා උප්පත්ති අවස්ථාවේදී හටගන්නා රූප. දැන් ප්‍රතිසන්ධි විඤ්ඤාණ තමයි හට ගන්නේ මවුකුසේ. ඉස්ඉස්සරවෙලාම කියල හටගන්නාවූ විඤ්ඤාණ ශක්තිය - හිත - ඒකත් එක්ක පහළ වෙනවා කර්මජ රූප කියල සවභාවයක්. ඒ කර්මජ රූප තිබෙන වෙලාවේදී චිත්තජ

රූප පහළ වෙන්නේ නෑ. ඒක නිසා තමයි **'ඔක්කන්තික්ඛණෙ'** කියන තැන චිත්තජ රූප කථාවක් කියන්නේ නැතුව **'නාමරූපං'** කියල කිව්වා. ඒ **'කර්මජ රූප ධර්ම'** සහ **'සිත'**. එතකොට එතැනදී රූප කලාප වර්ග 3 ක් පහළ වෙනවා කියල කිව්වනේ. ඒ තමයි හෘදය වස්තු රූපයට ආශ්‍රිත වස්තු දසක කලාපය - ඊළඟට කාය වස්තු කලාපය - ඊළඟට භාව වස්තු දසක කලාපය. දැන් මේ වස්තු දසක කලාපයක් ගත්තම ඒ කලාපයක තිබෙනවා රූප 10 . දැන් හොඳට අපේ මේ දහම් පාඩමේ මුල ඉඳලා මේ දක්වාම පෙළ ගැසීගෙන අහගෙන හිටපු පින්වතුන්ට මේක ඒ තරම් ගැඹුරු දෙයක් නොවෙන්ට පුළුවන්. නමුත් තවත් ඉතින් ගොඩක් අහගෙන ඉන්නවනේ. ඒ පින්වතුන්ගේ දැනගැනීම සහ මතකය නැවත අවධි කරලා මේ ධර්මයට ගලපාගැනීම පිළිබඳව මේ කියන්නේ.

දැන් රූප වර්ග 3 ක් ඔතන කර්මයෙන් පහළ වෙනවා කියල කිව්වා. ඒ තමයි කාය දසකය - භාව දසකය - වස්තු දසක. මේ කාය දසකයේ තිබෙනවානේ පඨවි රූපය - ආපෝ - තේජෝ - වායෝ - වර්ණ - ගන්ධ - රස - ඕජා - ජීවිතඉන්ද්‍රිය සහ ප්‍රසාද රූපය. එතකොට එතන තිබෙනවා රූප 10 ක්. මේ රූප දහයේ ප්‍රධාන 4 දෙනා පඨවි ආපෝ තේජෝ වායෝ. එතකොට මේක රූප කලාපයක්. මේකට කියනවා කාය වස්තුව එහෙම නැත්නම් කාය වස්තුව අවසන් කොට තිබෙන රූප කලාපය කියල. මේකෙ රූප 4 ක් මහා භූතයි ඊළඟට තව රූප 6 ක් උපාදාය රූපයි. පඨවි - අපෝ - තේජෝ - වායෝ කියන හතර මහාභූත රූප. ඊළඟට වර්ණ - ගන්ධ - රස - ඕජා - ජීවිතඉන්ද්‍රිය සහ ප්‍රසාද රූපය යන හය උපාදාය රූප. හැබැයි ඔය රූප 10 එක unit එකක් - එක කලාපයක් - එක රංචුවක්.

ඊළඟට තියෙනවා තව රූපයක් ඒකත් එක්ක හට ගන්න ඒ තමයි භාව රූපය. භාව රූපය කියල කියන්නේ ස්ත්‍රී භාවය හෝ පුරුෂ භාවය නියෝජනය කරන්නාවූ රූප ගුණයක් - රූප සවභාවයක් ඒ පළවෙනි අවස්ථාවේදීම හැදෙනවා. එතනත් තිබෙනවා පඨවි - ආපෝ - තේජෝ - වායෝ - වර්ණ - ගන්ධ - රස - ඕජා - ජීවිතඉන්ද්‍රිය සහ භාව රූපය. එතකොට මෙතනත් තිබෙනවා රූප 10 ක්. එතකොට පුංචිම පුංචි ඉතාමත්ම සියුම් වූ රූප ගුණ සවභාව 10 ක්. ඒකෙත් පඨවි - ආපෝ - තේජෝ - වායෝ හතර මහා භූතයි. ඉතිරි රූප 6 උපාදාය රූපයි. එතකොට දැන් රූප ගුලි - රූප කාණ්ඩ රංචු දෙකක්. පළවෙනි එක කාය දසක කලාපය දෙවෙනි එක භාව දසක කලාපය.

තුන්වෙනි ඒකතමයි වස්තු දසක කලාපය කියල කියන්නේ. එතනත් තිබෙනවා පඨවි රූපය - ආපෝ - තේජෝ - වායෝ - වර්ණ - ගන්ධ - රස - ඕජා - ජීවිතඉන්ද්‍රිය සහ වස්තු රූපය. මෙතනත් තිබෙනවා රූප 10 ක්. එතන මහා භූත රූප හතරයි - පඨවි - ආපෝ - තේජෝ - වායෝ - අනිත් ඒවා - වර්ණ - ගන්ධ - රස - ඕජා - ජීවිතඉන්ද්‍රිය සහ වස්තු රූපය. ඒවා කර්මජ උනත් ඒවා උපාදාය රූපයි. දැන් එතකොට මෙතැන තිබෙනවා රූප ගොඩවල් තුනක්. මේ ගොඩවල් තුනේ මහා භූත හතර - හතර - හතර තිබෙනවා තුනක්. උපාදාය රූපත් හය - හය - හය තියෙනවා තුනක්. එතකොට රූප 18 ක් උපාදාය රූප. මහා භූත උනත් තුන් තැනක තියෙන නිසා ඒක පඨවි අපෝ තේජෝ වායෝ ගොඩවල් තුනක තියෙනවා. මෙතැනදී **'මහාභූතා උපාදාරූපානං සහජාතපච්චයෙන පච්චයො'** දැන් මෙතන තිබෙන - අපි

උදාහරණයක් හැටියට ධර්ම කාරණය වටහා ගැනීම සඳහා හිතල බැලුවහම මෙතැන තිබෙන්නාවූ පඨවි ආපෝ තේජෝ වායෝ කියන මහා භූත රූපත් එක්කම අර ඉතිරි හයදෙනා එකට සහජාත භාවයෙන් අනිත් ඒවාගේ ප්‍රත්‍යය ලබාගෙන මේ මහා භූත රූපත් එක්ක උපදිනවා. කවදාකවත්ම මේ දසක කලාපයක එකකවත් අස්සට ගිහිල්ලා මහාභූත රූප උනත් අර උපාදාය රූපයන්ට ඉස්සරවෙලා ඒ කියන්නේ 'අපි මහා භූතයි' කියල ඉස්සරවෙලා කියනවා වගේ අනිත් ඒවා පසුවට පහළ කරන එහෙම ස්වභාවයක් නෑ. මේක මහා භූත ධර්මයොත් එක්කම උපාදාය රූප 6 ත් ඒ එක්කම පහළවෙන ගතියක් - ගුණයක් - ගුණ ස්වභාවයක් - අනිත් ඒවා අතහැරෙන්නේ නැතිවෙන්න පහළ වෙන ගතියක් ඒවගේ තුල තියෙනවා. ඒක නිසා තමයි කියන්නේ **'මහාභූතා උපාදාරූපානං සහජාතපච්චයෙන පච්චයො'** කියල. ඔය ගොඩවල් තුනේමත් එහෙමයි.

ඊළඟට පසු කාලීනව හැදෙනවනේ කර්මජ රූප වශයෙන් - චක්ඛු දසක කලාපය - සෝත දසක කලාපය - ඝාණ දසක කලාපය - ජිව්හා දසක කලාපය වශයෙන් කලාප 4 ක් පහළ වෙනවනේ. ආන්න ඒ දසක කලාප වලත් තිබෙන්නෙ ප්‍රධානවම මහා භූත රූප එක්ක අනිත් ඒවා පහළ වීමයි. ඒක නිසා තමයි මෙතනදී අර උද්දෙසය කියන කොට **'මහාභූතා උපාදාරූපානං සහජාතපච්චයෙන පච්චයො'** කියල කියන්නේ. එතකොට කර්මජ රූප හෝ වේවා චිත්තජ රූප හෝ වේවා ඍතුජ හෝ වේවා ආහාරජ හෝ වේවා උපාදාය රූපයක් වෙත්නම් ඒ උපාදාය රූපය මහා භූත රූපත් එක්ක තමයි පහළ වෙන්නේ. ඒක තමයි මෙතනින් අපි තේරුම් ගතයුතුව ඇත්තේ.

ඊළඟට තිබෙනවා '**රූපිනො ධම්මා අරූපීනං ධම්මානං කිඤ්චි කාලෙ සහජාතපච්චයෙන පච්චයො, කිඤ්චි කාලෙ න සහජාතපච්චයෙන පච්චයො'**. ඒක හැබැයි ටිකක් අපේ පින්වතුන්ට තරමක් දුරට තේරුම් ගන්ට බලමු.

**'රූපිනො ධම්මා'** කියල කියන්නේ **රූප ධර්මයනො**. ඊළඟට **'අරූපීනං ධම්මානං'** කියල කියන්නේ **නාම ධර්මයන්ට**. නාම ධර්මයන් එක්ක සමහර අවසථාවලදී සහජාත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙනවා. සමහර අවස්ථාවලදී එහෙම වෙන්නේ නෑ කියල කියනවා. එකක් තමයි ඔය ප්‍රතිසන්ධි අවස්ථාවේදී ඇතිවෙනවා නාමරූප ධර්මයෝ එකට උපදින ස්වභාවයක් තිබෙනවා. අනිත් අවස්ථාවලදී හැම එකක්ම එකට උපදින්නේ නෑ. 'කර්මජ රූප' සම්බන්ධයෙන් ගත්තොත් විතරයි අපි ඒ විදියට සලකා ගන්නේ. ඊළඟට සමහර අවස්ථාවකදී එහෙම වෙනවා සමහර අවස්ථාවකදී එහෙම වෙන්නේ නෑ කියල කියනවා.

දැන් අපි සහජාත ප්‍රත්‍යය ධර්ම පිළිබඳව කථා කරන කොට ඒතරම් ගැඹුරුම - ඒ කියන්නේ - එකට උපදිනවා කියන එකනේ. ධර්ම ගොනු විතරයි සලකා ගන්න තිබෙන්නේ - එකට උපදිනවා කියන එක.

තවත් එකක් තමයි මෙතන පාවිච්චි කරලා තිබෙනවා - ඒකත් මේ එක්කම තේරුම් ගන්න පුළුවන්. ස්කන්ධ 4 ක් **'අරූපිනො අඤ්ඤමඤ්ඤං'** කියල කියනවනේ. ඒ **'අරූපිනො අඤ්ඤමඤ්ඤං'** කියල කියනකොට එතන තියෙනවා අන්නෝන්‍ය වශයෙන් ඔවුනොවුන්ට

උදව් කරන උපකාර කරන මහා අමුතුම ගතියක්. දැන් හිත ගත්තම 'හිත' නිවන නෙමෙයිනේ. එතකොට හිත ගත්තහම ඒ හිතේ තිබෙන්නේ අරමුණක් දැන ගැනීමේ යම් කිසි ගුණ විශේෂ ස්වාභාවයක්නේ ලක්ෂණයක් හැටියට. ඊළඟට හිතත් එක්ක පහළ වෙනවනේ ප්‍රඥා ස්වභාවය - ප්‍රඥා චෛතසික. ඒ ප්‍රඥා චෛතසිකයේ තිබෙනවා අමුතුම විදියේ විශේෂිත ගුණ දැනගැනීමේ හැකියා ගුණයක්. ඒ ගුණය නොතිබෙන්ට අපිට නිවන් අවබෝධ කර ගන්ට බැරිවෙනවා. ඒ කියන්නේ ප්‍රඥාව කියන චෛතසිකය නොතිබුනා නම් අපිට නිවන් අවබෝධ කරගන්ට බෑ. එතකොට මේ නාම ධර්මයන්ගේ තිබෙන්නාවූ ස්වභාවයයි - රූප ධර්මයන්ගේ තිබෙන්නාවූ ස්වභාවයයි - ඒවා සංකලනය වෙන විදියයි - ඒවගේ ප්‍රමාණයි - ඒවාගේ තිබෙන්නාවූ වෙන වෙනම ක්‍රියා ස්වරූපයි - සියලූ දෙනාම එකට උනායින් පස්සේ සිද්ධ වෙන්නාවූ ක්‍රියා ස්වරූපයි - ඔක්කොම ටික දැන ගැනීමට විශේෂිත ගුණ ස්වභාවයක් තිබෙනවා, අපේ හේතු ඵල ධර්මයන්ගේම රාමුවේ තිබෙන එක විශේෂ ධර්මයකට - ඒ තමයි ප්‍රඥාව කියන ධර්මය. දැන් මේ ප්‍රඥාව කියන ධර්මයෙන් තමයි මේ අපි කථා කරන මේ දේවල් - විශේෂිත දේවල් අස්සට රිංගලා කියල හිතින් ස්පර්ශ කරලා දැනගන්නේ. දැන් ප්‍රඥාව කියන එක තනියෙන් උපදින්නේත් නෑ. ප්‍රඥාව කියන එකත් එක්ක හිත කියන එකත් වැඩිලා උපදින්න ඕන. හිතත් තියෙන්ට ඕනෑ - ඒක සහජාතයි. එතකොට අමුතුම ධර්මය කියල කියන්නේ, මේ අපි නොසලකා හැරියාට අපිට ප්‍රඥාවේ තිබෙන්නාවූ අඩුව නිසා නොසලකා හැරලා ඒ පැත්තට හිත යොමු වෙන්නේ නැතුව තිබුනාට, මේවගේ මහා විසාල හැඟවිච්ච - ඔවුනොවුන්ට උපකාරවෙන - එක ධර්මයක් තවත් ධර්මයක පිහිටලා - එක ධර්මයක් තවත් ධර්මයක උපකාරය ලබාගෙන ක්‍රියාත්මක වෙන මහා අමුතුම විදියේ ධර්මසවභාව රාශියක් මේකේ තියෙනවා. ඒක නිසා දැන් **'චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො'** කියල අර මුල් තුන අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය යෙන් ඒ කියන්නේ ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන ආකාරය කියනවා. **'චත්තාරො මහාභූතා අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො'** - සතර මහා භූත ධර්මයෝ ඔවුනොවුන්ට ප්‍රත්‍යය වෙනවා. ඊළඟට මිශ්‍රණයක් හැටියට - එතනත් තිබෙන්නේ **'ඔක්කන්තික්ඛණෙ නාමරූපං අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො'** - නාම රූප ධර්මයෝ උපදින අවස්ථාවේදී - මවු කුසක හටගන්නා අවස්ථාවේදී අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය ධර්ම හැටියට පහළ වෙනවා කියල.

එතකොට දැන් මේ සහජාත ධර්ම පිළිබඳවයි අඤ්ඤමඤ්ඤ ධර්ම පිළිබඳවයි එක ලඟ තේරුම් ගන්න පුළුවන්. හැබැයි මේක උද්දෙසික කොටස. නාමික වශයෙන් සහජාත - අඤ්ඤමඤ්ඤ - නිස්සය - උපනිස්සය ආදී වශයෙන් කියාගෙන ගියාට අපිට අනාගතයේ මෙහෙම ගිහිල්ලා ආපහු එන්ට වෙනවා මුලට. ආපහු මුලට ඇවිල්ල මුල ඉඳල යනවා වෙනත් ක්‍රමයකින් මේක විස්තර කරගෙන. ඒක නිසා දැන් අපි මේ විදියට කරගෙන යමු. අපි කැමතියි පසුගිය සඳුදාත් අපිට මේකට එන්ට බැරිඋනා. දැන් බොහෝ දුරට බ්‍රහස්පතින්දා තමයි යොදාගන්ට වෙන්නේ. අපි මේ පින්වතුන්ට කරුණාවෙන් මෛත්‍රියෙන් මතක් කරනවා ඒ පසුගිය දේශනාවේදී කියපු කරුණුත් එක්ක සාකච්ඡා කරන කොට ඇති කරගත්තාවූ -සාකච්ඡා වලින් මතු උනාවූ ප්‍රශ්න එහෙම තියෙනවානම් මේ වෙලාවේ අපි ඒ ප්‍රශ්නත් ඉදිරිපත් කරගෙන සාකච්ඡාවක් හැටියට අපි ඉදිරියට අරගෙනයමු. විශේෂයෙන්ම නිතර පොත පත කියවන්නාවූ ඒ වගේම බණ අහන්නාවූ ධර්ම සාකච්ඡා කරන්නාවූ පින්වතුන්ට මේ කරුණු

හොඳට තේරෙනවා. සමහර වෙලාවට ආධුනික භාවය සහ පට්ඨානය කියල කියන්නේ අති ගාම්භීර ධර්මස්වභාවයක්නේ - මාතෘකාවක්නේ - ඒ පට්ඨානය ගැන කථාකරන කොට මූලික ධර්මවල තිබෙන්නාවූ යම්කිසි හොඳ අවබෝධයක් තියෙන්ට ඕන. නැත්නම් එහෙම මේක පටලැවෙනවා. ඒකනිසා අපි මේ පිංවත් සැමදෙනාටම මෛත්‍රියෙන් මතක් කරනවා අපේ මේක මෙහෙය වන්නාවූ මහ්තමයලත් එක්ක ප්‍රශ්න තිබෙන ඒවා දැන් ඉදිරිපත් කරන්ට. ඒවාගේම අපි ඉදිරියට මේ අද කියපු ටිකත් එක්ක ගිය සතියේ කියපු ටිකත් එක්ක අපි සාකච්ඡාවට ඉදිරිපත් වෙමු. සාකච්ඡාවක් හරහා මේ ටික අපි ඉස්සරහට ගොනුකරලා ගමු. සැමදෙනාටම මේ ගාම්භීර ධර්මය හොඳින් තේරුම් අරගෙන ඒවාගේම හොඳින් වටහාගෙන උතුම් නිර්වාණ ධාතුව කියන සූක්ෂම වූ පරම සූක්ෂම වූ අති ගාම්භීර ධර්මය තේරුම් ගන්ට වටහා ගන්ට අවබෝධ කරගන්ට ලැබේවා කියල මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරනවා. දැන් අපි සාකච්ඡා කරමු.

හොඳයි බොහොම පිං ස්වාමීන්වහන්ස.

<u>ප්‍රශ්නය</u> - සවාමීන්වහන්ස අර සහජාත ප්‍රත්‍යය යටතේ අපිට එක තැනක් තිබෙනවා **'ඔක්කන්තික්ඛණෙ නාමරූපං අඤ්ඤමඤ්ඤං සහජාතපච්චයෙන පච්චයො'** කියන තැන ස්වාමීන්වහන්ස අපි දන්නවා දැන් **'ඔක්කන්තික්ඛණෙ'** රූප කොටස තුනක් ඔබවහන්සේ අපිට විස්තර කරලා දුන්න - කාය දසක - වස්තු දසක - භාව දසක වශයෙන්. එතනදී එතන නාම රූප හැටියට අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය යෙන් ප්‍රත්‍යය වෙන්නේ වස්තු දශකය ඒ ප්‍රති සන්ධි සිතට - ඒ දෙක තමයි අඤ්ඤමඤ්ඤ වශයෙන් අන්නෝන්‍යයන්ට උදව්වෙන්නේ කියල තේරුම් ගන්න එක නිවැරදියි කියල හිතනවා ස්වාමීන්වහන්ස. එතකොට අනිත් රූප කලාප දෙක ඇත්තටම අන්නෝන්‍ය වශයෙන් ඒ ප්‍රතිසන්ධි සිතට ප්‍රත්‍යය නොවන හින්ද එතකොට ඒක මෙතන සඳහන් වෙන්නේ නෑ. එතැනින් ඒක අපි ඉවත් කරගෙන වස්තු රූපය අඩංගු වස්තු දශකය තමයි ගන්න වෙන්නේ කියල ප්‍රතිසන්ධි විඤ්ඤාණයත් එක්ක අන්නෝන්‍යය වශයෙන් සහජාත ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙනව කියල. එහෙම හිතුවොත් නිවැරදිද සවාන්මීන්වහන්ස. තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - ඔව් ඒක හරි මහත්තය. ඒකත් අපි කියල දෙන එක සහ විස්තර කරන එක - ඔය ප්‍රතිසන්ධි සිත කියන එක මහා පුදුම බලයක් - පුදුමම බලයක් තිබෙන්නාවූ සිතක්. ඒක විපාකයක්නේ. ඒ විපාක සිත එතන පහළ වෙන්ට තිබෙන්නේ.. - ඕතන කුසල ශක්තියක් නෑ. ඉස්සෙල්ලා කරපු කුසලයක එහෙම නැත්නම් කර්මයක - ඕකේ තියෙන්නේ ඒකෙ විපාකය උලුප්පවලා දානගතිය. අපි හිතමු වතුර භාජනයක් - අපි හිතමු plastic භාජනයක් හරි මොකක් හරි දෙයක් වතුරක් අස්සකට දාල තියෙනවා. ගඟක හරි වැවක හරි යටකරගෙන තියෙනවා. ඒක හැම වෙලාවෙම බලන්නේ එකේ ඇතුලේ තියෙන්නේ වායෝ ධාතු නම් හරියට වතුරට මතුවෙන්න තමයි බලන්නේ. උඩට මතුවෙලා එන්ට. එතකොට අතඇරපු ගමන්ම ඒක ටස් ගාල උඩට එනවා. අන්න ඒවගේ ඉස්සල්ල කර්ම නිර්මාණය කරලා තිබ්බ්ච හිතක විපාක හැටියට මේ එනකොට ඒකේ විපාක හැටියට තියෙන කර්ම ශක්තිය හරි බලවත්. ඒක කර්ම එකතුකරන එකක් නෙමෙයි - කර්ම විපාක දෙවන සිතක්. කර්ම ශක්තිය බලවත්. ඒ කර්ම ශක්තිය බලවත් නිසා මේ විදියට තියෙනවා. තැන් දෙකක මේ විදියට වැඩ

කරනවා. එකක් තමයි දැන් අපි මේක තේරුම් ගැනීම සඳහා ඉදිරිපත් කර ගත්ත පංච වෝකාර බවය කියන එක - මවුකුස. අපි ඉන්න තැන මවුකුස නිසා - මවුකුසක් ආධාර කරගෙන ඉන්න නිසා අපි මෙතන මේකත් තේරුම් ගනිමු. ඊට පස්සේ දෙවන තැනත් හිතමු. මේ ප්‍රතිසන්ධි සිත හටගන්නා කොට - මේ ප්‍රතිසන්ධි සිත කියන එක විපාක වෙනකොට ඒ විපාකයක් දෙන කර්මය - ඒ කියන්නේ විපාකයක් හදන්ට පුළුවන් කර්මයක් හදල තිබුනනේ පරණ. ඒ කර්මය හදපු තැන - එතැන කර්මයක් හදල තියෙන්නේ රූපයක් ආධාර කරගෙන. රූපයක් ආධාර කරගෙන - රූපයක් මුල් කරගෙන - රූපයක් පිහිට කරගෙන තමයි එතන කර්ම හදල තියෙන්නේ. එතකොට රූපයක් ලඟ තියාගෙන කර්ම හැදුවනම් ඒකෙ විපාකය දෙන කොටත් ඒ රූපයක් දාල තමයි විපාක දෙන්ට වෙන්නේ. හරියට කෝප්පයට දාල තේ දෙනවා වගේ. එහෙම නැත්නම් පීරිසියක් තියල ඒක උඩ කෝප්පය තියන්න වගේ. කර්ම විපාක විඤ්ඤාණය එන්ට, තියෙන්ට ඕන රූපමය ගුණයක්. එතකොට මේ ඉස්ඉස්සෙල්ලාම මව් කුසේ ඉපදෙන කොට ඒ උපදින එක්කෙනාට  රූපයක් කියල එකක් නෑනේ. ඒක නිසා කර්ම ප්‍රතිසන්ධි හිතේ තියෙනවා ඒ හිතට ගැලපෙන්ට - හිතට ආවේනික වස්තු රූපයක් හදාගන්න හැකියාව  - හිතට ඉන්න. ආන්න ඒක තමයි ඔය වස්තු දශකය කියල කියන්නේ. දැන් අපි කියනවා හෘදය වස්තු රූපය කියල. ඇත්ත වශයෙන්ම ඔක්කොම muscle නෙමෙයි ඔය කියන්නේ. හෘදය වස්තු රූපය - මුලින්ම හට ගත්ත රූපමය ගුණ ස්වභාවයක්.  වස්තු රූපය තනියෙන් එන්නේ නෑනේ. වස්තු රූපය කර්මජ රූපයක් තමයි. වස්තු රූපය කර්මජ රූපයක් උනාට වස්තු රූපය ආධාර කරගෙන තමයි හිත පවතින්නේ. හැබැයි වස්තු රූපය ආධාර කරගෙන - ලංකරගෙන - ඒක පුටුව හැටියට තියාගෙන හිත පැවතුනාට වස්තු රූපයට තනියම ඉන්නබැරි නිසා වස්තු රූපය හටගන්ට නම් පඨවි තියෙන්ට ඕන ආපෝ තේජෝ වායෝ වර්ණ ගන්ධ රස ඕජා ජීවිතින්ද්‍රිය කියන අනිත් ඉතිරි රූප 9 යම තියෙන්ට ඕන. හැබැයි ඒ රූප 9 තිබුනට අර වස්තුරූපය තමයි ප්‍රධාන. ඒ ඉතිරි රූප ටික ඔක්කෝම උදව් උපකාර වෙන්නේ මේ වස්තු රූපය නිසා. වස්තු රූපය අධාරකරගෙන හිත තියෙන්නේ එතකොට  ඒක නිසා තමයි කියන්නේ **'ඔක්කන්තික්ඛණෙ නාමරූපං අඤ්ඤමඤ්ඤං සහජාතපච්චයෙන'** කියල කියන කොට ඒ වෙලාවේදී ඔය **අඤ්ඤමඤ්ඤං** කියල කියන්නේ වස්තු රූපයයි - (අර ඔක්කොම නෙමෙයි - අනෙත් ඒවා පිටිපස්සෙන් එනවා හැබැවයි ) හැබැයි direct - බොහොම ලඟින් 'ප්‍රතිසන්ධි හිතට' 'නාම ධර්මයන්ට' ඔවුනොවුන්ට  උදව් වෙන උපකාර වෙන ධර්මය තමයි අර 'වස්තු රූපය' කියන එක. ඒකනිසා තමයි **'ඔක්කන්තික්ඛණෙ නාමරූපං'** කියල - එක රූපයක් හරි රූපයක්නේ. ඒක නිසා මේක ගන්නවා. අනිත් ඒවා  එතනදී සලකන්නේ නෑ. හෘදය වස්තු ඇරුණුකොට තවත් තියෙනවනේ අර කාය රූපයේ තිබෙන 9 දෙනා - එතකොට එතනදී වෙන්නේ හෘදය වස්තුව අනිත් කර්මජ රූපයන්ට අපි කිව්වා වගේ ආධාර උපකාර වෙනවා සහ සහජාත ස්වභාවයෙන් ඉදිරිපත් වෙනවා.

තව එකක් මම කිව්වා කියන්නම් කියල ඒ තමයි දිව්‍යලෝකයක උපදින කොට එතන තිබෙනවනේ ප්‍රතිසන්ධි කර්මජ වස්තු රූපයකුත් තිබෙනවා - ඔක්කොම ටික පහළ වෙනවනේ - ඇස - කන - නාසය - දිව - ශරීරය. ආන්න එතනදිත් ගොඩක් මහා භූත රූපයෝ

අනිත් ධර්මවලට උපාදාය රූපයන්ට පිහිට වෙනවා. එක පාරම ඕපපාතිකව පහළ වෙන නිසා එතන තිබෙනවා සංකලන ධර්මයක්. එතනදී කටයුතු වෙන්නේ ක්‍රියාත්මක වෙන්නේ හෘදය වස්තුරූපය එක්ක තමයි අනිත් නාම ධර්මයෝ එකට ගැලපෙන්නේ සහ එකට උපදින්නේ. ඒ විදියට තේරුම් ගැනීම නිවැරදියි මහත්තය. අපේ පින්වතුන්ට තවත් තියෙන දේවල් අහන්ට අවස්ථාව සලසා දෙමු. තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u> - තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස බොහොම පිං. මේක සහජාත ප්‍රත්‍යයටම අදාළම ද කියන්න බැහැ. අදාළ නැත්නම් පස්සේ වෙලාවක සාකච්ඡා කරමු. ඔබ වහන්සේ කථා කල දසක කලාප - කාය දසක - වස්තු දසක - භාව දසක වගේ ඒ හැම එකේම එම ශුද්ධාෂ්ටකයේ අපි පඨවි ආපෝ තේජෝ වායෝ ඊළඟට වර්ණ ගන්ධ රස ඕජා කියන හතර ගැන මට කාලයක ඉඳල තිබුණ ප්‍රශ්නයක් තමයි වර්ණය කියන කොට ඇහැට අරමුණු වෙනවා - ගන්ධය නාසයට අරමුණු වෙනවා - රස දිවට අරමුණු වෙනවා එතකොට අනිත් ආයතන වලට අරමුණු වන - කනට ශබ්ධ වගේ නැත්නම් කාය ආයතනයට පොට්ඨබ්බ වගේ දේවල් අදාළ නොවෙන්නේ මේ ශුද්ධ අශ්ඨකය කියන කොට කියල ඒකට විශේෂ හේතුවක් තියෙනවද? එහෙම නැත්නම් ඒ ගැන පොඩි අදහසක් සඳහන් කරනවා නම් බොහොම පිං තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - හොඳයි මහත්තය හරි වටිනවා සියලු දෙනා වෙනුවෙන්ම ප්‍රශ්නය ගොනු කරන එක. ප්‍රශ්නයත් හරි වටිනවා. ඇත්ත වශයෙන්ම අරමුණු කිරීම වශයෙන් ගත්තම ඔය රූප 28 න් එකක්ම විතරයි ඇහැට ගෝචර වෙන රූප තියෙන්නේ. ඒකට කියනවා 'සනිදස්සන රූපය' කියලා. සනිදස්සන රූපයක් හැටියට ඇහැට ගෝචර වෙන එකම එක දේ තමයි වර්ණ රූපය. ඒ වර්ණ රූපය ශුද්ධාෂ්ටකයෙන් එකක්. ඊට පස්සේ දැන් සෝත ප්‍රසාදයට ගැලපෙන එකම එකයි - ඒ තමයි ශබ්ධ රූපය අපි ඒක හොඳට දන්නවා. නාසයට ඇත්ත වශයෙන්ම යොමු වෙන්නේ ගන්ධ රූපය. ඊට පස්සේ නාසයට ගන්ධය ඊට පස්සේ රසය දිවට. ශුද්ධාෂ්ටකයට ගත්තයින් පස්සේ අර ශබ්ධ රූපය ශුද්ධාෂ්ටකයේ එකක් නෙවෙයි. හැබැයි ආයතන ආරම්මණයක්. මෙතනදී වර්ණයට ඇස තියෙනවා - ගන්ධයට නාසය තියෙනවා - රසයට දිව තියෙනවා ඕජාවයි - ජීවිත ඉන්ද්‍රියයි - ඊළඟට අනිත් ප්‍රසාද වස්තුයි - ආපෝ ධාතුවයි - ඇවිල්ල ඉන්ද්‍රිය ගෝචර රූප නෙමෙයි. ඒවා ඇවිල්ල ධර්ම රූප. ඒ කියන්නේ මනසින් නැතහොත් හිතට අරමුණු වෙන්නාවූ - හිතින් දැන ගත යුත්තාවූ - ඒකේ එක්තරා විදියක ක්‍රියා ගුණයක් දැනගෙන - ඒ ක්‍රියා ගුණය හිතින් දැන ගත වූ දෙයක්. දැන් ඔය රූප දැනගන්න කොට ඔය ආපෝ ධාතුව, ඒක මනසට අරමුණුවන ධර්මාරම්මණයක් හැටියට තියෙන්නේ ඒක රූපයි - රූපයේ තිබෙන ගුණ විශේෂයක් නමුත් ධම්මාරම්මණයි. ඊළඟට තිබෙන ඕජා රූපයත් ඒ වගේ. ඕජා රූපය පෙනෙන්නේ නෑ. ඒක පංච ඉන්ද්‍රිය ගෝචරව හසුකර ගන්ට පුළුවන් එකක් නෙමෙයි. තවත් එකක් තිබෙනවා - ඔය රූප පිළිබඳව හරියට කරුණු කාරණා ලංකරගෙන හිතන කොට හොඳට දැනෙනවා. දැන් අපි හිතමු ඔය රූප 28න් එක රූපයක් තිබෙනවා පරිච්ඡේද රූපය කියල. ආකාස රූපය කියල. ඉතින් ඒකත් ඇවිල්ල අනිත් රූප ළඟම තිබෙන්නාවූ තවත් ගුණයක්. ඇත්තවශයෙන්ම හිතුවයින් පස්ස අපිට පාන් ගෙඩියක් කපන්න පුළුවන් කම තියෙන්නේ (ඕලාරිකව ගත්තහම) පිහිය කියන ආයුධය පාන් ගෙඩිය හරහා යවන්න පුළුවන් නිසා. ඉතින් යවන්න පුළුවන් කම තියෙන්නේ

ඇයි? ඒ පිහිය කියන එක ඒ පිහි පාර ඒ පාන්ගෙඩිය හරහා යවන්න පුළුවන් කම තියෙන්නේ ඒකෙ ඇතුලත පුංචි අපිට පෙන්නේ නැති අහසක් නියෝජනය වෙන නිසා. එතකොට අපිට පුළුවන් මේ බටර් - චීස් වගේ දේවල් - අපි හිතමු පාන් - ඒක ඇවිල්ල මෙලෙක් කියල කියමුකෝ - හරීම ගනකම තිබෙන චීස් වගේ දේකත් තිබෙනවා කපන්න පුළුවන් ගතිය. කපන්න පුළුවන් කියල කියන්නේ එතන ඒ ආහාරයේ තිබෙන්නාවූ අහස හරහා මේ පිහිය යනවා කියන එක. එතකොට ගලක් කඩන්න පුළුවන්. ගලක් කඩන්න පුළුවන් කම තියෙන්නේ යම් කිසි හීරීමක් තුලින් හෝ වේවා ප්‍රහාරයක් එල්ල කරලා - ඒකට පහරක් ගහල - දෙදරුමක් කරලා ඒක හරහා ඒ ගලේ ඇතුලත තිබෙන්නාවූ අහස කොටසින් තමයි ඕක දෙකට බෙදන්නේ. ඉතින් ඔය වගේ අපිට ඇයි ගලක් කඩා ගන්න පුළුවන් කම තියෙන්නේ? අහසක් ඒකෙ නියෝජනය වෙන නිසා. අහස කියල කියන්නේ ඇත්ත වශයෙන්ම බාහිර අහස නෙමෙයි. ඒ රූප ගොඩ - ඒ කියන්නේ පාන් කැල්ලක් හරි - එහෙම නැත්නම් චීස් කැල්ලක් හරි - ගලක් හරි - ඒක තියෙන තැන ඒකෙ අතරට බැහැල තිබෙන්නාවූ කොටස තමයි පරිච්ඡේද රූපය හැටියට කියන්නේ. හැබැයි ඒ පරිච්ඡේද රූපය රූපයක් හැටියට කිව්වට ඕක ඇහැට පෙන්නේ නෑ. අපි ඔය ක්‍රියා දාමය හරහා තමයි අපි තේරුම් ගන්නේ ඇත්තටම මෙහෙම එකක් තියෙනවා නේද මේකේ කියල. එහෙම නැත්නම් එහෙම අපිට මේක ක්‍රියාත්මක කරන්න බැනේ. දැන් අපිට ඔය අපේ ඉස්සරහ තියෙන අහසම කපන්න බැහැනේ. අහසම කපන්න බෑ. හැබැයි අපිට අහස කැලි කැලි වලට කැපුවට ඒක පේන්නෙත් නෑ දැනෙන්නෙත් නෑ ඒක වෙන්නෙත් නෑ. නමුත් වස්තුවක තිබෙන්නාවූ අහස හරහා ආයුධයක් යැව්වහම ඒ වස්තුව දෙකඩ වීම තේරුම් අරගෙන දෙකඩ වෙච්ච කාරණය තේරුම් අරගෙන ඒ අනුසාරයෙන් අපි එතන අහස තිබුණාය කියල තේරුම් ගන්නවා. ඒක බොරුවක් නෙමෙයි. ආන්න ඒ වගේ රූප වල තිබෙනවා සමහර රූප ඉන්ද්‍රිය ගෝචරයි - ඉන්ද්‍රියක් හරහා දැන ගන්න පුළුවන් රූප අනිත් ඒවා ධර්‍ම රූප. හැම රූපයක්ම කියන්නේ සියුම්ව ගත්තොත් එහෙම රූප කියල කියන්නේ එක්තරා විදියක ක්‍රියා ගුණයක් විතරයි. අර අපිට කියනවනේ පේන දේ මායාව කියල. ඇත්ත වශයෙන්ම ඒක මායාවක් තමයි. ඒක මායාව කියල කියන්නේ දැන් ඔය චීස් කැල්ලක් වගේම බටර් කැල්ලක් කපන්න පුළුවන් චීස් පෙත්ත වගේ. හැබැයි ඒ බටර් කැල්ල රත් වෙච්ච භාජනයක තිබ්බයින් පස්සේ අපි ඉස්සරහපිටම අර අපි ඉස්සෙල්ලා දැකපු චීස් කැල්ල වගේ පෙනිච්ච ඒ බටර් කැල්ල අපේ ඇස්දෙක ඉස්සරහ පිටම අපාට වෙලා දියාරුවෙලා ටික වේලාවක් තිබුනොත් එහෙම නැතිවෙලා යනවා. වාෂ්ප වෙලා නැතිවෙලා යනවා. අපි ඇත්තටම දකින්නේ රූපයන්ගේ රූප ක්‍රියාකාරී ස්වභාවයන්ගේ තිබෙන්නාවූ - එක සනීභාවයට පත් වෙලා තිබෙන්නාවූ - තද බල රූප ස්වභාවයක් තමයි අපි දකින්නේ. ඇත්තටම මායාවක්. ඉතින් ඔය විදියට සමහර රූප ධර්මාරම්මණයක් හැටියට තමයි තියෙන්නේ. ඒ විදියට හිතන එක හොඳයි තවත් මොනවා හරි තිබෙනවානම් ඉදිරිපත් කරන්න පුළුවන්. මම හිතනවා යම් කිසි උදව්වක් මේකෙන් වෙන්න ඇති කියල.

බොහොම පිං ස්වාමීන්වහන්ස ගැඹුරු ධර්‍මතාවයක් - එතකොට ක්‍රියා ගුණයක් ධර්‍මතාවයක් වගේ මනසට දැනගන්න පුළුවන් ස්වභාවයක්. ඒක එතකොට උපාදාය රූපයක් හැටියත් සලකන්න පුලුවන්ද? අවසරයි - තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - ඇත්තටම අපි ඔය රූප රූප කියල කිව්වට ඇත්තටම ඔය ඔක්කොම ක්‍රියා ස්වරූප. පඨවිත් ඔය වගේ. දැන් මේ පඨවි පඨවි පඨවි කියා කියා කිව්වට ඇත්තට ගැඹුරින් ඒක අවබෝධයට ගිය තැන මහත්තය ඒක ක්‍රියා මාත්‍රයක් විතරයි. පඨවි ධාතුවට කථාවෙන් තැනක් දීල තියෙනවා අපි. පඨවි ධාතුවට කථාවෙන් තැනක් දීල අපි පඨවි පඨවි පඨවි කියල ඒක මහා ගැඹුරින් කථා කර කර - කථා කර කර ඊට පස්සේ ඒ පඨවි ධාතුව හැටියට අපි සමහර වෙලාවට වැඩියෙන් බාර ගන්නේ වර්ණ රූපය. අපි හිතමු කළු ගලක්ය කියල. 'මේක මහ තද කළු ගලක් මේක නම් කඩන්න බෑ' කියල ඒ තද බව ඒ ගල දැක්ක පමණින්ම ඒකෙ තිබෙන තද ගතිය - ඒකෙ තිබෙන කඩන්න බැරි ගතිය ඔක්කොම තීරණය කරන්නේ අර වර්ණයට බැහලානේ. නැත්නම් ඇත්ත වශයෙන්ම අඩු තරමේ ගිහිල්ලා ගලට තට්ටු කරලවත් නෙමෙයිනේ. ආන්න ඒ වගේ පඨවි ධාතුව පඨවි ගතිය කථා කරන්ට අපි වැඩි බලයක් දීල පඨවිධාතුව නියෝජනය කරන එක හැටියට බාර ගන්නේ වර්ණ රූපය. ඔන්න ඔය වගේ ඕක බැලුවයින් පස්සේ වර්ණ රූපය ඇවිල්ල අපිට කඩන්ට බෑ. වර්ණ රූපය තද නෑ. හැබැයි වර්ණ රූපයේ එල්ලිලා තමයි අර ගලේ තද තීරණය කරන්නේ. ඔයවගේ පටලැවිලි අපේ තියෙනවා. දැන් ගැඹුරින්ම බැලුවට පස්සේ පඨවි කියල කියන්නෙත් ඇත්තටම ඔය කාය ඉන්ද්‍රියට දැනුනට ඒකත් එක්තරා විදියක ක්‍රියා මාත්‍ර විතරයි. ඔය රූප ධර්ම කියල කියන්නෙත් ක්‍රියා මාත්‍රා - ඊළඟට නාම මාත්‍ර කියල කියන්නෙත් ඊටත් වඩා සියුම් වූ ක්‍රියා මාත්‍රා. ඒ හැම එකක්ම - චෛතසික කියල කියන්නෙත් එක්තරා ක්‍රියා ධර්ම ස්වරූපයක්. සිත කියන්නෙත් ක්‍රියා ධර්ම සවරූපයක්. ප්‍රඥාව කියන්නෙත් ක්‍රියා ධර්ම සවරූපයක්. ඊළඟට ඔය රූප ධර්ම කියන්නෙත් ක්‍රියා ධර්ම ස්වරූප. ක්‍රියා ධර්ම ස්වරූපයක් වෙන්න බැරි එකම ධර්මය තමයි නිර්වාණ ධාතුව. ඊට මෙහා පැත්තේ ඔක්කෝම තියෙන්නේ ක්‍රියා ස්වරූප. පඨවි ධාතුව ආදී වශයෙන් කථා කරන සියලුම දේවල් ක්‍රියා ස්වරූප. සමහර තැන් වලදී සමහර සියුම් දේවල් කිව්වට පස්සේ මිනිස්සුන්ට තේරෙන්නේ නැති හින්ද - ඒ වෙලාවට හිතන්න පුළුවන් බණ වෙනස් කරනවා කියල. මම එහෙම දැකලත් තියෙනවා internet එකේ දාලත් තියෙනවා. හැබැයි ඇත්ත වශයෙන්ම මේවා රූප කියල කිව්වට රූප කියල කියන්නෙම එක්තරා ක්‍රියා ගුණ විශේෂයකටමයි. තෙරුවන් සරණයි!

බොහොම පිං ස්වාමීන්වහන්ස ඇත්තටම හරිම වටිනවා. මම හිතනවා අපි මේවා සේරම කථා කරන්නේ මේවා ඉක්මවා යන ප්‍රඥාවක් ලබා ගන්න කියල. මොකද මූල පරියාය සූත්‍රයේ **'පඨවිං පඨවිතො මඤ්ඤති' –** පෘතක්ජනයා - රහතන් වහන්සේ **'පඨවිං පඨවිතො අභිඤ්ඤාය පඨවිං න මඤ්ඤති'** කියන එකට ඔබ වහන්සේ මේ අවසානයේ කියපු ටික හරියටම ගැලපෙනවා කියල හිතෙනවා. බොහොම පිං අපි අනිත් කල්‍යාණ මිත්‍රයන්ටත් අවස්ථාව දෙන්න මම නිහඬ වෙන්නම් තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u> - තෙරුවන් සරණයි ඔබ වහන්සේට ගොඩක් පිං. එතකොට ස්වාමීන්වහන්ස මෙතනදී තනිකරම ඔප්පුවෙලා ඉවරයි සත්ව පුද්ගල ආත්මයක් නෑ ශක්තීන් විතරයි තියෙන්නේ කියන එක.

<u>ස්වාමීන්වහන්ස</u> - අනිවාර්යෙන්ම ශක්තීන් විතරයි තියෙන්නේ. ශක්තියක් එනවා ශක්තියක් .. ඔය කථාව හරි. ශක්තීන් විතරයි තියෙන්නේ. හැබැයි ඒ ශක්තීනුත් මහ අන්තිම පණ නැති

දුර්වල ශක්තීන්. ඒ කියන්නේ දැන් අපි හිතමු මෙහෙම - දැන් අපි එක්තරා විදියක ක්‍රියාවක් හැටියට ඉල්ලිපිලා එන නිසා ශක්තිය කියල කියනවා. දැන් අපි අත්දෙක තියාගෙන හොඳට බෙල්ල කෙලින් තියාගෙන අපි වාඩි වෙලා අපි හිතමු භාවනා කරනවා කියල. ඔය භාවනා කර කර ඉන්න කොට ශරීරයේ අපේ යම් යම් තැන වල පඨවි ගතිය කියල තේරුම් ගන්නවා. තද ගතිය කියල තේරුම් ගන්නවා. තව දණ හිස තද උනා ඊට පස්සේ බෙල්ල තද උනා - ඊට පස්සේ ඒ තද වෙච්ච ගතිය - ඒක ඇවිල්ල ක්‍රියාවක්නේ. ඒ ක්‍රියා ගුණයක්නේ ඔය මතුවෙලා ඉලිප්පිලා එන්නේ. ඒ ටික වැඩි වෙච්ච හින්දනේ අපි තදට ක්‍රියා ටික ඔක්කොම එක මිටියකට අල්ලලා තද ගතියක් කියල හිතින් ඒකට මහා පර්වතයක size එකක් දීල ඒක භාර ගන්නේ හිතෙන්. හැබැයි එච්චර එකක් නැනේ. දැන් ඒක මතුවෙලා ආවේ මතු වෙන ක්‍රියා ස්වරූපයක් තිබ්ච්ච හින්දනේ. හැබැයි පඨවි කොටස කියල වෙන් කරලා ගන්ට බෑ කැල්ලක් කඩල. ඒක ඉතින් ඔහේ ඉල්ලිපිලා මතුවෙලා පිපිලා ආව. ඊට පස්සේ තව ටික වේලාවක් යනකොට ඒ හරියේ ඉස්සෙල්ල තිබ්ච්ච පඨවි ගතිය දැන් නෑ ඔන්න. දැනෙන්නේ නෑ. ඒ දැනෙන්නේ නෑ කියල කියන්නේ ඒක දැන් එතන දැන් නෑ. ඉස්සෙල්ල දැනුනේ ඇයි. ඉස්සෙල්ල තිබුණ. දැන් ඒක නිකං පර වෙලා අපෝ වෙලා මැලවිලා ගිහිල්ලා දැන් එතන නෑ වගේ. දැන් මේ පඨවි ධාතුව දුර්වල පණ නැති එකක්යයි කියල කියන්නේ ඒ පඨවි ධාතුව ක්‍රියාවක් හැටියට ආවානම් ඕක තියෙන්න එපාය. ඒක තියෙන්නේ නෑ. තියෙන්නේ නැත්තේ ඉන්න බැරි හින්ද. ඉන්න බෑ කියන්නේ දුර්වලකමනේ. පුළුවන් කමක් තියෙනවා නම් ඉන්න එපාය. පවතින්න එපාය. ඒක නිසා එක විදියක ශක්ති විශේෂයක් ක්‍රියා ගුණ විශේෂයක් තමයි හැබැයි අන්තිම පණ නැති ඒවගේම රඳා පවතින්ට බැරි හැකියාවක් ඇති - බලයක් වීරත්වයක් නැති ගති තමයි තියෙන්නේ. ඒක නිසා සත්වයෙක් පුද්ගලයෙක් ඕකට කිට්ටු කරලා තියා ගන්න බෑ. හේතුව කඩා හැලෙනවනේ. වැටෙනවනේ. ආන්න ඒකයි. තෙරුවන් සරණයි!

එහෙමයි සවාමීන් වහන්ස බොහොම පිං ස්වාමීන්වහන්ස ඔබ වහන්සේට.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන් වහන්ස අර **'චිත්තචෙතසිකා ධම්මා චිත්තසමුට්ඨානානං රූපානං සහජාතපච්චයෙන පච්චයො'** කියන තැනේදී ස්වාමීන්වහන්ස අපිට හොඳටම තේරෙනවා ප්‍රතිසන්ධි සිත කියන එකෙන් චිත්තජ රූප හැදීමට හැකියාවක් නෑ. ඒක ඒ පැත්තෙන් දුර්වලයි නමුත් කර්මය පැත්තෙන් බලවත් වෙන අවස්ථාවක් තමයි ප්‍රතිසන්ධි කියල කියන්නේ කියල. ඒ වගේම සවාමීන්වහන්ස අපි දන්නවා ද්විපංචවිඤ්ඤාණ එහෙම නැත්නම් අර අහේතුක සිත් ගොඩේ තියෙන චක්ඛු සෝත ඝාණ ජිව්හා කාය - අකුසල සහ කුසල විපාක කියන සිත් 10 ඒ වගේම අරූපී විපාක සිත් එනම් ආකාසඤ්ඤායතනය - විඤ්ඤාණඤ්චායතනය - ආකිඤ්චඤ්ඤාය - නේවසඤ්ඤා නාසඤ්ඤායතනය යන සිත් 4 ත් - එතැන නම් අපිට තේරෙනවා ප්‍රතිසන්ධිය ගන්න ආස්ථාවලදී අරූපී තලයක රූපයක් හදන්ට බැරි හින්ද එතන රූප හදන්නේ නැති බව තේරෙනවා. සවාමීන්වහන්ස එතකොට, ඒවගේම තියෙනව අරහන්ත චුති සිතෙන් රූප හදන්න හැකියාවක් නැහැයි කියල. ඒක සිද්ධ වෙන්නෙත් දැන් සංසාරයේ කෙලවර කරන කොට ඒ සිතේ දුබල ගතිය හින්දද? අර ද්විපන්ච විඤ්ඤාණ වලිනුත් රූප හදන්නේ නැත්තේත් ඒ සිත්වල තියෙන දුබල ගතිය හින්දද කියලත් අපිට පොඩ්ඩක් විස්තර කරලා දෙන්න සවාමීන්වහන්ස තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - රූප හදන්න පුළුවන් ගුණ ස්වභාව තිබෙන්නාවූ සිත්වල විතරයි ඔක වෙන්නේ. හේතුව ඔය සිතකට රූප හදන්ටත් - එකක් තමයි විපාක ගතිය හින්ද ද්විපන්ච විඤ්ඤාණයන්ගෙන් හදන්නේ නෑ. අනිත් එක තමයි ආම්පන්න අඩුයි ඒකේ. ඒ කියන්නේ ඔය ද්විපන්ච විඤ්ඤාණවල තියෙන්නේ සර්ව චිත්ත සාධාරණ චෛතසික ටික විතරයි. වෙන එකක් එහෙම apply වෙන්නෙත් නෑ. ඒක විපාකයක් එකක් අනෙත් එක තමයි ඒක ආම්පන්න එහෙම හරි අඩුයි. තවත් එකක් තියෙනවා අර ප්‍රතිසන්ධිය දෙන අවස්ථාවේදී අරූපී ලෝක වල ඒ ප්‍රතිසන්ධි සිතේ රූප හදන්නේ නැත්තේ ඒ රූපයන්ට තිබෙන්නාවූ ආසාව - ඇලීම අයින් කරලා ගත්ත - බේර ගත්ත ‘විඤ්ඤාණ ටිකක්’ විපාක හැටියට ආපු නිසා තමයි එතැනදී එහෙම වෙන්නේ. අනිත් එක තමයි - මේ රහත් මාර්ගයට පත්වන කොට රහත් මාර්ගයෙන් කර්ම හදන එකත් නැති කරා. ඒවා ආචයගාමී නෙමෙයිනේ - අපචයගාමී. එතකොට ඒ රහතන් වහන්සේගේ හිතේ කෙලෙස් ධර්ම සියල්ල අනුශය සමග නසපු නිසා ඊට පස්සේ චිත්තජ රූප හදන්ට එහෙම පුළුවන් කමක් ඇත්තෙ නෑ ඒ රහතන් වහන්සේගේ චුති සිතේ. ඒකත් ඇවිල්ල විපාක සිතක්නේ.

තව එකක් තියෙනවා මහත්තය - මම මේක මීට ඉස්සර වෙලා කියල නැතුව ඇති. අපේ සියලු දෙනාම හොඳට අවදානයෙන් අහගෙන ඉන්න. ප්‍රතිසන්ධිය ගන්න අවස්ථාවේ ප්‍රතිසන්ධි සිත් කියන එක දන්නවනේ. ප්‍රතිසන්ධි සිතට තියෙනවා හැකියාවක් ඒකට අවේනික රූප හදන්ට පුළුවන්. සමහර අය කාටහරි කෑම බෙදන කොට මම දැකල තියෙනවා කෑල්ල කෑල්ල අරගෙන කටේ දාගන්නවා. ඒ කියන්නේ අනිත් අයට බෙදනවා - හැබැවයි - තමනුත් ඒකෙන් යැපෙනවා. එහෙම එකක් තියෙනවා. ප්‍රතිසන්ධි සිත රූප නිෂ්පාදනය කරන කොට ප්‍රතිසන්ධි සිත කරන්නේ, කර්ම ශක්තිය තමන්ට යැපෙන්න රූපයකුත් හදා ගන්නවා - තමන්ගේ බලයෙනුත් හදනවා. තමන්ගේ බලයෙන් - සම්පූර්ණ කර්ම ශක්තියෙන් රූප වෙන පැත්තකට යන ඒවත් හදනවා. ඔය භාව රූප ආදිය ඒවා තමන්ගේ පැත්තට නෙමෙයි නමුත් වස්තු රූපය කියන එක - බෙද බෙදා යනකොට තමන් කටේ දාගන්නවා වගේ තමන්ට ප්‍රයෝජන පිණිස එකකුත් හදා ගන්නවා. ඔය විදියට තියෙනවා කර්ම රූප හැදෙන ස්වභාවයක්. හැබැයි චිත්තජ රූප නෑ. ඊට පස්සේ ප්‍රතිසන්ධි සිත ඇතිවෙන කොට ප්‍රතිසන්ධි සිතේ කර්ම බලයෙන් රූප හැදුවට දෙවෙනි හිතේ ඉඳල හැදෙනවා ප්‍රවෘති කර්මජ රූපයි ඊළඟට චිත්තජ රූපයි කියල දෙකක්. ප්‍රතිසන්ධි සිතේ **‘හිතයි’** ප්‍රතිසන්ධි සිතේ තිබෙනවා ඒකට අදාල යම් කිසි **‘චෛතසික’** ප්‍රමාණයක්. **‘සිතයි’** **‘චෛතසික’** ප්‍රමාණයක් තිබෙනවා. හැබැයි මෙතැනදී හිතයි චෛතසික ස්වභාවයයි ගත්තම කර්මජ රූප ගතිය තමයි වැඩි එතන. හිතේ බලය එහෙමට එන්නේ නෑ. ඊට පස්සේ තියෙනවා දෙවෙනි සිතට යනකොට එතනදී රූප හැදීම සඳහා හිතත් බලවත් වෙනවා රූප හැදීම සදහා කර්ම විපාකයත් බලවත් වෙනවා. ඒක නිසා හැදෙනවා වර්ග දෙහෙක විපාක රූප හැදෙනවා. අනිත් එක ඒක දෙවෙනි හිතේ ඉඳල ප්‍රවෘතිත් වෙනවා ඒවාගේම චිත්තජත් වෙනවා. තව එකක් තියෙනවා ඔය චිත්තජ රූප (හොඳට මතක තියා ගන්න චිත්තජ රූප හැදෙන්නේ නෑ ප්‍රතිසන්ධි සිතේ) දෙවෙනි හිතේ ඉඳල තමයි චිත්තජ රූප හැදෙන්නේ. දෙවෙනි සිත් කියල කියන්නේ ප්‍රතිසන්ධි සිත නෙවෙයි. ඒක භවාංග. එතකොට මේ භවාංග සිතේ චිත්තජ රූප හදන ගතිය තිබෙනවා හැබැයි ඒ තරම් පණ නෑ. හොඳම හොඳ බලවත් ශක්ති සම්පන්න රූප එහෙම නෙමෙයි.

නිකම්ම නිකං දියාරු රූප තමයි හදන්නේ. ඒක තේරුම් ගන්න පුළුවන් භවාංග සිත කියල කියන එක විපාක සිතක්නේ. විපාක සිත කියල කියන්නේ කර්ම රැස් කරන හිතක් නෙමෙයි. කර්ම රැස් කරන හිතයි විපාක විඳීම් වශයෙන් තියෙන සිතයි වර්ග දෙකක්. මේ විපාක සිතේ තිබෙන ඒවා පණ නෑ. ඔය මොනවා හරි දෙන එකක්. ඒක තේරුම් ගන්ට පුළුවන් මෙන්න මෙහෙම - දැන් අපි හැන්දෑවට නිදාගන්නවනේ. එතකොට හොඳට නින්ද යනවා. නිදා ගත්ත කියල කියන්නේ අපි අර ප්‍රතිසන්ධි අවස්ථාවේදී ලබාදීපු ඒ හිත ප්‍රායෝගික වශයෙන් මෙතනදී භවාංග නමින් අපි අත් විඳිනවා. භවාංග ගතකරගෙන අපි භවාංග හිතේ ඔහේ ගැලිල ඉන්නවා. ඒ භවාංග සිත් තියෙන කොට ප්‍රවෘති කර්මජ රූපත් තියෙනවා. ගොඩක් ඉතින් තද බල විදියට නින්ද ගිය හින්ද ඉතින් අපිට චිත්තජ රූපත් තියෙනවා. දැන් චිත්තජ රූප තියෙන එක්කෙනා දැන් භවාංගයෙන් හදපු රූප ටිකේ තියෙන ස්වරූපය බලන්නකෝ. නිදාගෙන නැගිටින කොට නැගිටින්න පුළුවන්යැ. ඉතින් හෙමිහිට එහෙට මෙහෙට තෙරපිලා ඇලිල බැඳිල යන්තම් හිමිහිට අර ලෙඩා වගේ අඩිය තියල ඊට පස්සේ හරි අමාරුවෙන් සමහර වෙලාවට නැගිට්ටයින් පස්සෙත් විසිවෙනවා. ඉතින් ඔන්න රූප වල හැටි. ඒ කියන්නේ ඒ ශරීරයේ දිගටම හැදිලා තියෙන්නේ චිත්තජ රූප. මොන චිත්තජ රූපද භවාංග සිතේ විපාක වශයෙන් හදෙන චිත්තජ රූප. ඒවා හරි දුර්වලයි. ඒවා පන නෑ. ඒවා ලොකු මනුස්සයකුට ගහන්න තරම් හරි නැත්නම් ශරීරය ඔසවාගෙන හොඳට පණ ඇතුව දුවන්න හරි එහෙම මේකක් එකේ නෑ. චිත්තජ රූප හදන කොටත් ඒ හිත පණ ඇති හිතක් වෙන්ට ඕන. ඊළඟට රූප හදන ගතිය නැති උනායින් පස්සෙත් කොහොමත්ම හැදෙන්නේ නෑ. විපාක හැටියට තියෙන ඒවගෙත් - හැදිච්ච ඒවගෙත් - තියෙන්නේ හරි පණ නැති රූප. අනිත් එක තමයි ඔය චෛතසික වලත් තිබෙනවා අඩුපාඩුවක් ඒක නිසත් ඔය ද්විපන්ච විඤ්ඤාණයන්ගෙන් එහෙම රූප නිෂ්පාදනය වීම කියන්නේ නෑ. තෙරුවන් සරණයි!

තෙරුවන් සරණයි! බොහොම පිං සවාමීන් වහන්ස

<u>ප්‍රශ්නය</u> - තෙරුවන් සරණයි! ස්වාමීන්වහන්ස දැන් ඉස්සෙල්ල ප්‍රශ්නයේදී රහතන් වහන්ස්ගේ සිත විසංකාරගත හිතක් නිසා උන්වහන්සේගේ චුතිය සිද්ධ වන අවස්ථාවේදී සංස්කාර අරමුණු එන්න විදියක් නෑ නේද ස්වාමීන්වහන්ස නැවත භවයක් කරා යන්න. එහෙම හිතන එක හරිද?

<u>පිළිතුර</u> - ඒකත් හරි - මෙහෙම තියෙනවා - අපිට රහත් උනත් සමහර ධර්ම න්‍යායන් වෙනස් කරන්න බෑ. අපි හිතමු රහතන් වහන්සේටත් වඩා ඉහළයිනේ පසේ බුදුරජාණන්වහන්සේලා. පසේබුදුරජාණන්වහන්සේලාටත් වඩා ඉහළයි ලොව්තුරා බුදුරජාණන්වහන්සේලා. අපි ලොව්තුරා බුදුරජාණන්වහන්සේගේ සිතින් කතාකරමු බලන්ට. ලොව්තුරා බුදුරජාණන්වහන්සේගේ හිත ප්‍රතිසන්ධිය ගන්නේ හරිම ප්‍රභාශ්වර ආලෝකමත් සෝමනස්ස ස්වභාවයකින් පිරිච්ච විපාක හිතක්. සෝමනස්ස සහගත පිරිච්ච ඥාන සම්ප්‍රයුක්ත අසංකාරික වූ මෛත්‍රීයට මුල් තැන දුන් මෙත් සිතකින් හට ගත්ත - මෛත්‍රීයකින් - මෛත්‍රී භාවනාවකින් ඇති වුනාවූ විපාකයකින්නේ ඔය හට ගන්නේ. දැන් දානමය පින්කම් තියෙනවනේ - දානමය පින්කම් තියෙනවා - සීලමය පින්කම් තියෙනවා - භාවනාමය

පින්කම් තියෙනවා - මෛත්‍රී භාවනා පින්කම් තියෙනවා - විදර්ශනා භාවනා පින්කම් තියෙනවා ඔය වගේ දැන් පින්කම් load එකක් අපේ හිතේ තියෙනවනේ. දැන් ඔය වෙසස්සන්තර ජාතකයේ දන් දීපු ඒවා ඊට ඉස්සරවෙලා දන් දීපු ඒවා ඔහොම තියෙනවනේ. ලොව්තුරා බුදුරජාණන්වහන්සේ ප්‍රතිසන්ධි ගන්න අවස්ථාවේ මොන දේවල් තිබුනත් මෛත්‍රී භාවනාවක - මෛත්‍රී පූර්වාංගම කුසල චේතනාවක් තමයි එතනට ඉදිරිපත්වෙලා තියෙන්න. එතකොට **'සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික මෙත් සිතකින්'** තමයි ප්‍රතිසන්ධිය හට ගන්නේ - මහාමායා දෙවීන්වහන්සේගේ කුසේ පිළිසිඳ ගන්නේ. දැන් ඒ හිතම තමයි - දැන් හොඳට හිතන්න - ඒ වෙලාවේදී ප්‍රතිසන්ධියට මුල් උනේ යම් කිසි අරමුණක් නම් උන්වහසේ මෛත්‍රී භාවනාව කරපු හැටි හරි මෛත්‍රී භාවනාව කරන්ට පාවිච්චි කරපු ආසනේ හරි ඊළඟට සත්වයෝ හරි මොකක් හරි අරමුණු තුනෙන් එකක්නෙ එන්නේ - කර්ම - කර්ම නිමිති - ගති නිමිති. දැන් ඒ ප්‍රතිසන්ධියට අරමුණු වෙච්ච දේම තමයි උන්වහන්සේට භවාංග සිතේ හට ගන්නේ. භවාංග සිතේ තියෙන්නෙත් ඒකමයි. ඊළඟට චුතියට එනකොට උන්වහන්සේ අවසානයේදී චුති ............ ඒක නිසා ප්‍රතිසන්ධි අරමුණයි භවාංග අරමුණයි චුති අරමුණයි කියල කියන්නේ ඒ අරමුණු තුනම එක සමානයි. එතකොට ඒ අවස්ථාවේදී ඒ හිත්වල තිබෙන්නාවූ රූප නිෂ්පාදනය කිරීමේ හැකියාව සහ නොහැකියාව වෙනස් වෙනවා. ඒක තීරණය වෙන්නේ මාර්ග සිතෙන්. එතකොට අර ප්‍රතිසන්ධි සිතේ උන්වහන්සේට කිසිම සංඛාර ගතියක් නැති නිසා - කර්ම නිෂ්පාදනය කිරීම් නැතිවෙච්ච නිසා - ඊළගට උන්වහන්සේ කිසිම ඇලීමක් - උපාදානයක් ඔය කිසිම දේකට නැති නිසා ඒකෙ රූප හැදෙන්නෙත් නෑ වගේම උන්වහන්සේ අවසානයේදී මේ සංසාරයෙන් නිදහස් වෙලා - සංසාරයෙන් මිදිලා - යන්නේ අනිත්‍ය දැකගෙනවත් නෙමෙයි -අනාත්මය දැකගෙනවත් නෙමෙයි. ඒ මොකක්වත් නෙමෙයි. ඒවා සිද්ධ වෙන්නේ මාර්ග අවස්ථාවේ. හැබැයි උන්වහන්සේ නිවන් අරමුණු කරගෙනත් නෙමෙයි පිරිනිවන් පාන්නේ. උන්වහසේගේ අවසාන හිතට එන ධම්මය අරමුණ තමයි උපදින අවස්ථාවේදී ගත්ත මෛත්‍රී පූර්වාංගම අරමුණ. ඒකෙන් තමයි උන්වහසේගේ පිරිනිවන් පාන්නේ. ඕක සාධාරණයි රහතන් වහන්සේටත්.

බොහොම පිං ස්වාමීන්වහන්ස එතෙන්දි අර අවසානයේදීත් කියන්නේ රහතන් වහන්සේටත් පසේ බුදුරජාණන්වහන්සේටත් ඒවගේම ලොව්තුරා බුදුරජාණන්වහන්සේටත් අවසාන වශයෙන් ඇතිවෙන චිත්ත වීථිය කාමාවචර චිත්ත වීථියක් කියන එක කියල එහෙම හිතුවොත් නිවැරදිද කියල තේරුම් කරල දෙන්න ස්වාමීන් වහන්ස.

<u>ස්වාමීන්වහන්සේ</u> - හරි මහත්තය ඒක හරි. ඒ කියන්නේ ගත්ත ප්‍රතිසන්ධි සිතම තමයි භවාංගය වෙන්නේ ඒකම තමයි චුතිය වෙන්නේ. ඒක නිසා ගත්ත අරමුණ අරමුණමයි. හැබැයි මරණාසන්න චිත්ත වීථි කියල වෙනමම චිත්ත වීථි වැඩ කරනවා. ඒවගේ ජවන් හරි අඩුයි. ඒවාගේම කර්ම රූප හදන්නෙත් නෑ. වෙන රූප හදන්නෙත් නෑ. ඒකනිසා උපාදානයත් නෑ. අනුශයත් නෑ. ඒ මොකක්වත් නැතිනිසා ඒ විදියට තමයි. කවදාකවත් රූපාවචර සිතකින් නෙමෙයි අරූපාවචර සිතකින් නෙමෙයි මාර්ග සිතකින් නෙමෙයි ලෝකෝත්තර සිතකින් නෙමෙයි ඔය පිරිනිවන්පෑම සිද්ධ වෙන්නේ - ඒ ආපු ඒකෙන්ම

තමයි සිද්ධ වෙන්නේ. ධර්ම අවබෝධකර ගැනීමට තමයි ධර්ම විදීමට තමයි මාර්ග සිතයි ඵල සිතයි දෙක උදව් වෙන්නේ. චුතියට නෙමෙයි.

ස්වාමීන්වහන්ස එතනදී අවසානයට යම් කිසි අරමුණක් ඇවිල්ල ඒ අනුවනේ චිත්ත වීථිය පහළ වෙන්නේ. එතකොට ඒ අරමුණ කාමාවචර අරමුණක් කියල සලකන එක නිවැරදියි නේද ස්වාන්මීන්වහන්ස?

<u>සවාමීන්වහන්සේ</u> - ඔව් ඒක කාමාවචර අරමුණක්මනේ. දැන් අර කාමාවචර ලෝකයක උපදින වෙලාවේ කාමාවචර විපාක සිතකටනේ උන්වහන්සේ දැන් මේ කාමාවචර මනුස්ස ලෝකේ උපදින කොට  ඒකට අනුවනේ ඉපදුනේ. ඒක නිසා ආරම්මණයත් ඒ විදියමයි. විපාක සිතක්. කාමාවචර ලෝකයට තිබෙන්නාවූ සියුම් වූ ධර්ම ස්වාභවයක් හැටියට සලකන රූපයක් තමයි ඉදිරිපත් වෙන්නේ.

ස්වාමීන්වහන්ස ඒ චුති සිත පමණක් නෙමෙයි. චුති සිත අනිවාර්යෙන්ම ප්‍රතිසන්ධි සිතට සමාන සිතක් බව තේරෙනවා. එතෙන්දි අර අවසාන චිත්ත වීථියට අරමුණු වන අරමුණ කාමාවචර අරමුණක් නේද කියන එක තමයි දැන ..

<u>ස්වාමීන්වහන්සේ</u>- අනිවාර්යෙන්ම - මෙහෙමයි තියෙන්නේ - හැබැයි ඒ අරමුණ - කෙලෙස් තියෙන සත්වයා දකින විදියයි බාර ගන්න විදියයි ඊළඟට  කෙලෙස් නැතිකරපු කෙනෙක් බාර ගන්න විදියයි වෙනස්. ඒ විතරක් නෙවෙයි ඔය අනාපාන සති භාවනාව 16 ආකාරයකට වඩපු කෙනාට එයා කෙළෙස් නැතිකරලා නැතත් කායානුපස්සනාව වශයෙන් - අනාපනසතිය, වේදනා - චිත්ත - ධම්මානුපස්සනාව වශයෙන් පරිපූර්ණව උතුම් ලෙස වඩපු කෙනාට අවසානයේදීත් එයාට ඒකෙ තිබෙන්නවූ ධර්ම ස්වභාව වටහාගෙන අපවත්වෙන්න පුළුවන්. වෙලා තියෙන්නේ එතනදී අනුශය ධර්ම නැතිකරපු නැති නිසා ඒවගේ කෙනෙකුට ප්‍රතිසන්ධිය සිද්ධ වෙනවා. හැබැයි අර මරණාසන්න චිත්ත වීථියේදී අරමුණු වෙන්නාවූ දේවල් තුල අනිත්‍ය එහෙම දැකීම - ඒවගේ තිබෙන්නාවූ අස්ථිරත්වය දැකීම සිද්ධ වෙනවා ඔය රහතන් වහන්සේලාට හැබැයි චුතියෙදී අරමුණු වන්නේ අරකමයි.

බොහොම පිං ස්වාමීන්වහන්ස ඒවගේම දැන්  අරූපී තලයකින් චුතවන බ්‍රහ්මයකුට පවා අවසාන වශයෙන් අරමුණු වෙන්නේ කාමාවචර අරමුණක් කියන එකසාධාරණද සවාමීන් වහන්ස?

<u>සවාමීන් වහන්සේ</u> - ඔව් එහෙමත් තියෙනවා මෙහෙම තියෙනවා - දැන් සමහර අයගේ අදහසක් තියෙනවා මේ අරූපාවචර බ්‍රහ්මලෝකයේ පහළ උනාම එතනදී ප්‍රතිසන්ධිය ඔක්කෝම විපාක හැටියට ඔහේ තිබිල තිබිල තිබිල වෙන මොකක්වත් හිත පහළ වෙන්නේ නෑ කියල. ඇත්තට එකේදී ඔය කාමාවචර සමහර අහේතුක සිත් එහෙම පහළ වෙනවා. ඒවා නැතුව චිත්ත වීථී එහෙදි නිර්මාණය වෙන්නේ නෑ. එහෙම නැත්නම් එහෙම, ගියායින් පස්සේ ප්‍රතිසන්ධිය උනා -  ඊට පස්සේ දිගටම නිදාගත්ත වගේ භවාංග වෙලා හිටිය - ඊට පස්සේ

චුතිය වෙනවා - එහෙම එකක්නේ තියෙන්නේ. දැන් සමහර වෙලාවට ධර්ම ස්වභාවයක් හැටියට තියෙනවා මෙහෙම. මෙහේදී අනාගාමී භාවයට පත්වෙලා - අපි හිතමු අනාගාමී භාවයට පත්වෙලා එහෙම නැත්නම් සෝවාන් වෙච්ච එක්කෙනෙක් අරූපා වචර වැඩුවොත් අපි උපකල්පනය කරමු සෝවාන් වෙච්ච එක්කෙනෙක්. ඇත්ත වශයෙන්ම දැන් එයාගේ ආත්ම ගාන සීමා උනා. ඒ ධර්මය හැටියට. එයා ධ්‍යාන වඩල අරූපාවචර ධ්‍යාන වඩා ගන්නවා. අරූපාවචර ධ්‍යාන වඩා ගත්තම උපදින්නේ අරූපාවචර බ්‍රහ්මලෝකයේ හැබැයි සෝවාන්. එහෙම එක්කෙනා එහෙ ඉඳල ඉඳල යම් කිසි විදියකින් අර කුසල ධර්මයනුත් හොඳට වැඩිලා තිබුන නම් ධර්මස්වභාවයක් හැටියට මෙතනදී චිත්ත වීථි එකකින් දෙකකින් ගිහිල්ලා ඊටපස්සේ මාර්ග ඵලත් අවබෝධකරගෙන එතැනින්ම හිත පරිනිර්වාණයට පත්වෙනවා කියල කියනවා. දැන් ඒක රූපාවචර බ්‍රහ්මලෝකයක්නේ අනගාමීන් වහන්සේලා ගිහිල්ලා උපදින්නේ. ඒකෙ කිසිම කථාවක් ප්‍රශ්ණයක් නෑ. ඒක ඉතින් බ්‍රහමලෝක වල උඩට යනවා ගිය ගමන්ම හරි ඒක සිද්ධ වෙනවා. ඒක රූපාවචර එක්කනේ.

අතනදී සිද්ධ වෙනවා - හැබැයි එතනදී චුත වෙනකොටත් ඒ කාමාවචර සිත්වලට අයිති හිතක් එනවා. ඒක වෙන්නේ බහුතරයක් පහළ වෙන්නේ - බොහෝ වශයෙන් පහළ වෙන්නේ අරූපා වචර සිත් නිසා තමයි ඒකට කියන්නේ අරූපා වචර ලෝකය කියල. හැබැයි ඒකෙන් කියන්නේ නෑ සම්පූර්ණයෙන්ම අනිත් සිතුවිලි පහළ වෙන්නේ නෑ කියල. හැබැයි කාම සිතුවිලි පහළ වෙන්නේ නෑ. ඒකත් මතක් කරන්න එපාය. කාම සිතුවිලි පහළ වෙන්නේ නෑ. තරහ යන සිතුවිලි පහළ වෙන්නේ නෑ. ඒවත් කාමාවචරයිනෙ. ඒවා පහළ වෙන්නේ නෑ. අර චිත්ත වීථියකට අයිතිවෙච්ච අහේතුක සිත් වල ඒවා පහළ වෙනවා.

ඒකෙ අවසාන එක ඇත්තටම දැනගන්ට හුගක්වෙලාවට ඕන කම තිබුනේ ස්වාමීන්වහන්ස දැන් එතෙන්දිත් කාමාවචර මනෝද්වාරික චිත්ත වීථියකින් වගේ චුත වීම සිද්ධවෙනවාද කියල.

<u>ස්වාමීන් වහන්සේ</u> - අනිවාර්යෙන්ම, හේතුව ආයතන නැති නිසා පංචද්වාරික චිත්ත වීථි ඇති වන්නේ නැනේ.

එහෙමයි ස්වාමීන්වහන්ස

<u>ප්‍රශ්නය</u> - අවසරයි සවාමීන්වහන්ස දැන් කලින් කථා කරපු එකේදී ප්‍රතිසන්ධි අවස්ථාවේදී විතරයි කර්මජ රූප වලට ප්‍රත්‍යය වෙන්නේ කියල කියනවා හිත. ප්‍රතිසන්ධි හිත විතරයි කියන එක. ඊට පස්සේ කර්මජ රූප වලට නාම ධර්ම වලින් කිසිම සම්බන්ධයක් ඇතිවෙන්නේ නෑ වගේ තමයි තේරෙන්නේ සවාමීන් වහන්ස මේ ප්‍රත්‍යය ධර්ම කියවනකොට. එතකොට කොහොමද ස්වාමීන්වහන්ස මරණාසන්න චිත්ත වීථියක චිත්තක්ෂණ 17 කට කලින් කර්මජ රූප ඉපදෙන එක නතර වෙනවා කියනවා. එතකොට කොහොමද සවමීන්වහන්ස මේ හිතේ සම්බන්ධයක් නැතුව කර්මජ රූප හටගෙන ගිහිල්ලා අන්තිමට මරණාසන්න මොහොතට කලින් කර්මජ රූප නතර වෙන්ට හේතුව කොහොමද සවාමීන් වහන්ස අපි ගලපා ගන්නේ. තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - මරණාසන්න චිත්ත වීථිය ඇවිල්ල ඒක හිතක් හැටියට නෙමෙයි කර්මය හැටියට ඉස්සරහට පවතින්ට බෑ. ඒක නවතිනවා කියල කියන්නේ - මරණාසන්න චිත්ත වීථිය ඇරුනහම හැම චිත්තක්‍ෂණයකම ප්‍රවෘති කර්මජ රූපයක් හදනවා. එතකොට අපි හිතමු කර්මජ රූපයක් අනිත් සිතකින් හැදුවොත් ඒ කර්මජ රූපයට අයිති චිතක්ෂණ 17 ක් යනවා. එතකොට කර්මජ රූපයක් හැදුන එක සිතකින් ඊට පස්සේ චිත්තක්‍ෂණ 17 ක් ගිහිල්ලා තමයි ඒකෙ අභාවය සිද්ධ වෙන්නේ. දැන් මරණාසන්න සිතේ අපි හිතමු චිත්ත වීථියේ තියෙනවා කියල 17 ක් - ඒකෙ වැඩ කරන්නේ ඇත්තවශයෙන්ම 14 . ඒකෙ හැදෙනවා කියල අපි හිතමු. එතකොට ඒ 14 හැදෙනවා. පළවෙනි එකේ දෙවෙනි එකේ තුන්වෙනි එකේ හැදෙනවා.දැන් බලන්ට පළවෙනි හිතේ කර්මජ රූප හැදුනොත් 14 වෙනි එකට ගිහිල්ල මැරෙනකොට මැරිලත් කර්මජ රූප තියෙනවා චිත්තක්‍ෂණ තව 3 ක්. අපි හිතමු දෙවෙනි චිත්තක්ෂනයේත් කර්මජ රූප හැදුනයි කියල. එතකොට මනුස්සය චිත්තක්‍ෂණ 14 රෙදි මැරුණොත් එහෙම ඊට පස්සෙත් තව චිත්තක්ෂණ 4 ක් විතර තියෙනවා මෙයාට. අපි හිතමු අවසාන අවස්ථාවේදී චුති චිත්තය කියන්න 14 කියල කිව්වොත් එහෙම 13 වෙනි එකෙත් හැදුනයි කියල එතකොට 13 වෙනි එකෙත් හදුනානම් හැදෙන්නේ කර්මජ රූප 17 කට ආයුෂ ඇතුව. එහෙම උනායින් පස්සේ මැරිලත් එයාගේ ජීවිතේ කර්මජ රූප තියෙනවා. කර්මජ රූප තියෙන්න නම් හිත තියෙන්ට ඕනේ. එතකොට හිත නැතුව කර්මජ රූප රඳා පවතින්නේ නෑ. ඒක නිසා මරණාසන්නයට කිට්ටු වෙනකොට ලංවෙන්ට ලංවෙන්ට ලංවෙන්ට අර චිත්ත වීථිය ආරම්භ වෙන කොට 17 කට මෙහා පැත්තේ ඉදල පහළ වෙන්නේ නෑ කියල කියන්නේ දැන් මෙතනින් යන්ට එයා සුදානම්. තව දුරටත් ඉස්සරහට පවත්වාගන්ට කර්මජ රූප නිෂ්පාදනය කිරීම වශයෙන් අඩියක් තියල දෙන්ට බෑ. දැන් ඔතන ප්‍රශ්නේ එන්නේ හෘදය වස්තුවනේ. හිතට ඉන්න තැනක් තියෙන්ට එපාය. හිත ඉන්නේ හෘදය වස්තු රූපයේ හැටියට කර්මජ රූප පහළ වෙනවා දිගට. ඒක පහළ වෙලා යම්කිසි විදියකින් මරණාසන්න චිත්ත වීථියේදීත් හෘදය වස්තු රූපයේ පරම්පරාවක් තවත් පහළ උනොත් එහෙම ඒ හිතට අයින්වෙන්න බෑ. හේතුව ඒ කර්මයෙන් හදාපු රූප ටිකේ තවත් අල්ලගෙන ඉන්නවා. කර්මජ රූප මරණාසන්න චිත්ත වීථියේ හදන්නේ නැති නිසා තමයි හිතට ඊළඟට ඉන්න බැරි වෙනවා. දැන් එයා කර්මයෙන් හදාපු චිත්ත පරම්පරාවෙන් ආපු එකක් නෑ දැන්. දැන් මේක අඩ තලේට තියෙන්නේ. ඉතින් ගැලවිලා යනවා. ආන්න ඒ ධර්ම ස්වභාවය ඕකේ තියෙනවා.

අවසරයි ස්වාමීන්වහන්ස ඒකෙදි එහෙම ගත්තම තේරුම් ගන්න පුළුවන්. මේකෙදි මම දැක්කේ නැහැනෙ කොහෙවත් ප්‍රතිසන්ධි ක්ෂණයෙන් පස්සේ කරමජ රූප හටගන්න හිත් කොහෙවත් නෑ වගේනේ ස්වාමීන්වහන්ස දැන් කියන කොට තේරෙන්න. එතකොට භවාංග හිතෙනුත් කර්මජ රූප හදන්නේ නැහැ. අනිත් සිත් වලිනුත් කර්මජ රූප හදන්නේ නැති විදියක්නේ සවාමීන් වහන්ස තියෙන්නේ. එතකොට කොහොමද ස්වාමීන්වහන්ස අපි ඒක තේරුම් ගන්නේ. හිතත් එක්ක සම්බන්ධයක් නැහැ වගේ තේරෙනවා කර්මජ රූප හට ගන්න චුතිය වෙනකම්ම. එතකොට කොහොමද ඒ අන්තිම මොහොතේ සම්බන්ධ වෙන්නේ කියන එක තමයි මට ප්‍රශන්යක් උනේ හෘදය වස්තු රූපයත් එක්ක සම්බන්ධවෙලා නතර වෙනවද නැත්නම් හිතත් එක්ක සම්බන්ධ වෙලා නතර වෙනවද කියන එක ස්වාමීන් වහන්ස. තෙරුවන් සරණයි!

<u>සවාමීන්වහන්සේ</u> **-** ඒක හරි පුදුම ධර්මස්වාභවයක් මහත්තයා ප්‍රතිසන්ධි සිතේදී ආරම්භක කර්මජ රූප ටික හදල දෙනවා. ඊට පස්සේ මරණාසන්නයට එනකම්ම දිගටම භවාංගයත් එක්ක ප්‍රවෘති කර්මජ රූප හදල දෙනවා. මේ රූප වර්ග දෙකක් තියෙනවා. එකක් තමයි ප්‍රතිසන්ධි කර්මජ රූප සහ ප්‍රවෘති කර්මජ රූප කියල. මේ දෙවෙනි සිත හෙවත් භවාංග සිතේ ඉඳල ප්‍රතිසන්ධිය අයින් වෙච්ච ගමන්ම ඉස්සරහට දිගටම යන්නේ ප්‍රවෘති කර්මජ රූප. ඒක හදල දීමේ ශක්තිය දිගට තියෙනවා. ප්‍රවෘති කර්මජ රූප හදන එක නවතිනව මරණාසන්න චිත්ත වීථියේදි. තවත් එකක් තියෙනවා මේ රූප හදනවා කියන එක හරි පුදුමයි. ඒකියන්නේ කර්මය මුල් කරගෙන ඍතුවෙනුත් රූප හදල දෙනවා. ඒකට කියනවා කර්මය සමුට්ඨාන වෙලා ඍතුවෙන් හදනවා කියල. දැන් සමහර අයට මේ ඔය සම්පත් එහෙම හම්බවෙනවා. අපි හිතමු ඉඩමක් තියෙනවා. ඒ ඉඩමේ හතර වටේම ඉන්න මිනිස්සුන්ගේ ඒවා පාලුයි. මොකක්වත් ගහක් කොළක් හැදෙන්නේ නෑ. හැබැයි හොඳට කර්ම ශක්තිය තියෙන්නාවූ පුණ්‍ය ශක්තිය තියෙන්නාවූ කෙනාගේ ඒ කර්මය හේතුවෙලා වටපිටාවේ ඍතුජ රූප හැදෙනවා කියනවනේ. හොඳටම පොහොර තියෙන ගුණයක් - ගස්කොළන් හැදෙන ගුණයක් - ගස් වැවෙන ගුණයක් ඒකෙ තියෙනවා. ඇත්ත වශයෙන්ම ගස් වැවෙන ගුණය ඇවිල්ල කර්මයේ එකක් නෙවෙයි. ඒක ඇවිල්ල ස්වභාවයෙන්ම ඍතුවෙන් හැදෙන එකක්. හැබැයි ඒ ඍතුවට යම්කිසි බලපෑමක් කරනවලු කර්මයෙන්. ඒක නිසා කියනවා **'කර්ම සමුට්ඨානික ඍතුජ රූප'** කියල. සමහර අයට තියෙනවා බඩ ගිනි දැනෙන්නේ නෑ කියනවනේ. එතෙන්දි තියෙනවා කර්ම සමුට්ඨානික රූප ස්වභාවය. යම් කිසි මනුස්සයකුගේ ජීවිතයේ ඕනෑම දෙයක් දිරවා යෑමේ ශක්තිය තියෙනවා. ඒවගේ කර්ම සමුට්ඨානික ඍතුජ රූප තියෙනවා. ප්‍රවෘති කර්මජ රූප තියෙනවා. ඔය නවතිනවා කියල කියන්නේ ප්‍රවෘත්ති කර්මජ රූපයි.

තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස

<u>ප්‍රශ්නය</u> **-** පොඩි දෙයක් පැහැදිලි කර ගන්න ස්වාමීන්වහන්ස මේ නිරෝධ සමාපත්තියට සමවදින වෙලාව ගත්තොත් අපි දන්නවා එතන කිසිම සිතක් ඇතිවෙන්නේ නැහැ කියල. භවාංග සිත් පවා ඇතිවෙන්නේ නැහැ කියල. එතැනදී කියනවා ඉන්ද්‍රියන් ප්‍රසන්නයි කියල. ඒ කියන්නේ එතනින් තේරුම් ගන්නෙ අපි කර්මජ රූප ටික කිසිම දුර්වල වීමක් නෑ ඒක දිගින් දිගට ප්‍රවෘති වශයෙන් සන්තති වශයෙන් පවතිනවයි කියල. සවාමීන්වහන්ස එතැන කොහොමද අපි තේරුම් ගන්නේ. අපි හිතනවනේ සිතක් සම්බන්ධ වෙන්නෙම නැහැයි කියල. කර්මජ රූප වල පැවැත්මට ස්වාමීන්වහන්ස.

<u>සවාමීන් වහන්සේ</u> **-** හරි වෙන්නේ නෑ. ඒ කියන්නේ කර්මජ රූප හට ගන්න සිතක් අවශ්‍ය නෑ. ඒක දිගට යනවා. දැන් රහතන් වහන්සේ පැය හතරක් පහක් එහෙම හිත නවත්වල හිතත් නෑ මොකක්වත් නෑ නමුත් කර්මජ රූප ටික දිගටම අල්ලලා දුන්නයින් පස්සේ දිගටම යනවා. තව එකක් තමයි අසංඥ තලයේ සත්වයෙක් උප්පත්තිය ලබුවයින් පස්සේ එයාට කිසිම හිතක් නෑ. නමුත් ඒ කර්මජ රූප ටික දිගටම යනවා. ආන්න ඒ වගේ හිත සම්බන්ධ නෑ. චිත්තජ රූප තමයි ඊට පස්සේ ටක් ගාල පටන් ගන්නේ ඒ හිතේ. අනිත් ඒවා නවතිනවා.

හොඳයි බොහොම පිං ස්වාමීන්වහන්ස

<u>ප්‍රශ්නය</u> - තෙරුවන් සරණයි ස්වාමීන්වහන්සේ පොඩි ප්‍රශ්නයක් තියෙනවා ස්වාමීන්වහන්ස ආනන්ද රහතන් වහන්සේ පිරිනිවන් පෑවේ තේජෝ කසිණයට සමවැදිලා. ස්වාමීන්වහන්ස ඒ වාගේ චිත්ත වීථියදී ප්‍රතිසන්ධි සිත් බලපනවාද නැත්නම් තේජෝ කසිණයෙන් පිරිනිවන් පානවද?

නෑ චුති සිත ආවයින් පස්සේ මොකක්වත් කරන්න බෑ. ඒක ඇවිල්ල කෙලින්ම අර bording pass එක වගේනේ. මොකක්වත් කරන්න බෑ. කරගන්න දෙයක් ඔක්කොම - අධිෂ්ඨාන - තේජෝ ධාතුව - ඔක්කොම - ඒ ධ්‍යාන වලට සමවදින ඒවා - ඔක්කොම - ඒ රහතන් වහන්සේලා, ඒ ධ්‍යාන වලට සමවැදිලා ඉස්සරවෙලා, චුති චිත්ත වීථිය පටන් ගන්න කලින් උන්වහන්සේලාට පේනවනේ. රහතන් වහන්සේලාගේ තිබෙන ස්වභාවය තමයි මෙන්න මේ වෙලාවේදී මෙන්න මෙච්චරයි තව මගේ ජීවිතය පවතින්නෙ තව චිත්ත වීථි ලක්‍ෂයයි තව චිත්ත වීථි 50,000 තව චිත්ත වීථි 25,000 යි තව සිත් මෙච්චරයි කියල හොඳට දකින්න පුළුවන් ගතියක් තියෙනවා. උන්වහන්සේලා ඒ ටික දැන ගත්තයින් පස්සේ මගේ ජීවිත ඉන්ද්‍රිය පවතින්නේ මෙච්චරක් සිත් තියෙන කල් විතරයි කියල හොඳටම දකිනවා. ඒක නිසා ඒ රහතන් වහන්සේලා ඒක දැක්කම ඊට කලියෙන් අධිෂ්ඨාන කරනවා. ඊට කලියෙන් අදිෂ්ඨාන කරනවා මගේ රූපය මෙන්න මේ විදියට වේවා කියල. ඒක නිසා ඒ පිරිවන් පෑවාට පස්සේ සිද්ධ වෙන්ට තියෙන සිදුවීම - ශරීරයට වෙන්ට තියෙන දේ උන්වහන්සේලා ශක්තිය දාන්නේ ඒ චුති චිත්තය පහළ වෙන්ට - මරණාසන්න චිත්ත වීථිය පහළ වෙන්ට කලියෙන්. එහෙම දේවල් සිද්ධ වෙනවා. එහෙම කරන්න පුළුවන්. ඒක සාමාන්‍යයෙන් එතැනදී ධ්‍යාන බලයෙන් සිද්ධ වෙනවා. ඒවාගේම සාමාන්‍යයෙන් අපි සාමාන්‍ය ලෝකයේදීත් හිතා ගන්නවනේ දැන් 'මම අහවල් දවසේ මේ විදියට මේ විදියට කරන්න ඕන' කියල අධිෂ්ඨානයෙන් යුක්තව යම්කිසි target එහෙකට වැඩ කරනවනේ. ඒකෙත් ගිහිල්ලා ඒ දාපු හිත තමයි පස්සේදී අපට සාර්ථකත්වයට එන්නේ. ඒවගේ ඊටත් වඩා සියුම්ව සිද්ධ වෙන දෙයක් තමයි ධ්‍යානයකට සම වැදිලා උන්වහසේලා සිත නැවැත්තුවත් ඒ ධ්‍යානයෙන් දාපු ඒ බලය මතුවෙලා තමයි අර තේජෝ ධාතුව ඉදිරිපත්වෙලා උන්වහසේලගේ ශරීරය ගිනිගන්නේ.

අප්‍රමාණ පිං ස්වාමීන්වහන්ස සාධූ! සාධූ! සාධූ!

බොහොම පිං ස්වාමීන්වහන්ස මම හිතනවා අදත් අපිට විශේෂ කරුණු රාශියක් ස්වාමීන්වහන්සේ අපට පැහැදිලි කර දුන්න. අප්‍රමාණ පිං. ඉතින් අපි සවනට සිසිලස වෙනුවෙන් ස්වාමීන්වහන්ස ඔබ වහන්සේට පුණ්‍යානුමෝදනා කරනවා පතනාවූ බෝධියකින් නිර්වාණ ධාතුව අවබෝධ වේවා කියල. එහෙමනම් ස්වාමීන්වහන්සේට අද වැඩ සටහන නිමා කරනට නැවත් වරක් ඔබ වහසේට යොමු වෙනවා. තෙරුවන් සරණයි!

<u>ස්වාමීන්වහන්සේ</u> - හොඳයි සැම දෙනාටම තෙරුවන් සරණයි! ඉතින් අපි මේ කාල වෙලාවත් අරගෙන පින්වතුන් සැමදෙනාම එක්කාසු වෙලා ධර්ම සාකච්ඡාවකට ඉදිරිපත් උනා. ඉතින් අද මේ ධර්මය ඇසීම තුලින් සාකච්ඡා කිරීම තුලින් ඥානය සිහිය නුවණ යෝනිසෝමනසිකාරය තවත් අපි දියුණු කරගත්ත. බුදුරජාණන්වහන්සේගේ ධර්මයට ලං උනා. ඉතින් ආර්ය ධර්මයට ලං උනා. ඒනිසා අද මේ ධර්මය ඇසීමෙන් සාකච්ඡා කිරීමෙන්

උපදවාගත්ත සියලු කුසල ධර්මයන්ද පුණ්‍ය ධර්මයන්ද ඒවාගේම තුනුරුවන්ගේ සරණත් හේතු වෙලා අපේ පිංවත් ලලිත් දළුවත්ත මහත්මයාට නිරෝගී සැප දීර්ඝායුෂ වේවා කියල අපි මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරමු. ඒ මහත්මයාටත් පවුලේ සැම දෙනාටමත් ශාන්තියක් වේවා! සැනසිල්ලක් වේවා! ඉතින් ඒ මහත්මයා ආරම්භ කරපු මේ වැඩ සටහන දිගින් දිගට පවත්වාගෙන යන කල්‍යාණ මිත්‍ර මණ්ඩලයේ සැම දෙනාටමත් මේ ධර්ම සාකච්ඡාව මෙහෙයපු පිංවත් ජයන්ත මහත්මයාටත් ඒවාගේම ප්‍රශ්න ඇසූ ඒ පිංවත් මහත්මා මහත්මීන් සැමදෙනාටමත් ලෝකවාසී මෙය අසන්නාවූ සැම දෙනාටමත් ධර්ම අවබෝධය වේවා! නිර්වාණ අවබෝධය වේවා! ඒවාගේම දුකක් කරදරයක් නැතුව හොඳින් අවශ්‍ය කරන බෝධි පාක්ෂික ධර්ම ශක්තිය දියුණු කරගන්ට ලැබේවා! පාරමී ගුණ දියුණු වේවා! හැම දෙනාටම කෙළවර බුද්ධාදී උතුමන්වහන්සේලා අවබෝධ කරගත්ත සදාකාලික සැප ඇති අමාමහ නිර්වාණ ධාතුව සුවසේම අවබෝධ වේවා! ඒ සඳහා මෙය උපනිශ්‍රය ධර්මයක් පාරමී ධර්මයක් ප්‍රතිපදාවක්ම වේවා! කියල මෛත්‍රියෙන් ප්‍රාර්ථනා කරනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලභෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථේරානං - ආගතං පටිපටියා
සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං



ඉහත සඳහන් ධර්ම දේශනාව

අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.